# මාසික මහ සභා රැස්වීම - 2022/08/09 දින

## අලව්ව ප්‍රාදේශීය සභාව

2022/08/09 වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 53 වන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**<u>මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා</u>**

1. ගරු සභාපතිනි - පද්මා වැත්තෑව මැතිනිය
2. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ජේ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - එච්.ජේ.සී. නිලූ ගුණරත්න මැතිනිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ජයතිලක මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**<u>මෙදින මහ සභාවට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා</u>**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 53 වන මහ සභා රැස්වීමට සපැමිණි අපේ සියලුම මන්ත්‍රිතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාත් අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ප්‍රධාන කොටගත් එම නිළධාරීන් ඇතුළු සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

## 01. 2022/07/12 දින මහ සභා වාර්තාව ස්ථිර කිරිම.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2022.07.12 දින මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තාව ස්ථිර කිරිමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2022.07.12 දින පැවති VI වන සැසිවාරයේ 52 වන මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව ස්ථිර කිරිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන</u>

i. සභා වාර්තාවේ 04 වන පිටුවේ ගරු සභාපතිතුමිය විසින් කරනු ලබන නිවේදන අංක 02.2 යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්. ජයතිලක මැතිතුමාගේ ප්‍රකාශයේ **"**ඔබතුමියගේ චේතනාව තිබෙන්නේ අයවැය ආදායම් ගැටළුකාරී තත්වයකින් තොරව සභාව කියවීමයි.**"** යනුවෙන් සඳහන් වී ඇති ප්‍රකාශය **"**ඔබතුමියගේ චේතනාව තිබෙන්නේ අයවැය ආදායම් ගැටළුකාරී තත්වයකින් තොරව සභාව **ගෙනයාමයි."**යනුවෙන් සංශෝධනය විය යුතුය.

ii. සභා වාර්තාවේ 40 වන පිටුවේ වෙනත් කරුණු යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්. ජයතිලක මැතිතුමාගේ ප්‍රකාශයේ **"**නගරබද වරිපනම් බදු ප්‍රදේශවල බදු ටික සම්පූර්ණ කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.**"** යනුවෙන් සඳහන් වී ඇති ප්‍රකාශය නගරබද වරිපනම් බදු ප්‍රදේශවල අක්‍රිය වී ඇති විදුලි පහන් යථා තත්වයට පත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.**"** යනුවෙන් සංශෝධනය විය යුතුය.

iii. සභා වාර්තාවේ 42 හා 43 වන පිටුවල වෙනත් කරුණු යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්. ජයතිලක මැතිතුමාගේ ප්‍රකාශයේ **"**ලක්ෂ ගානක් රාජ්‍ය නිලධාරින් අතර උගත් භාවයෙන් වගේම නැණගුණ දෙකම තිබෙන රාජ්‍ය නිලධාරිනියක්.**"** යනුවෙන් සඳහන් වී ඇති ප්‍රකාශය **"**රටේ ලක්ෂ ගානක් රාජ්‍ය නිලධාරින්ට උගත්කම මැනවින් තිබුණත් උගත් භාවයෙන් වගේම නැණගුණ දෙකම තිබෙන රාජ්‍ය නිලධාරීන් ඉතා අල්පයි. එම අල්ප වූ ගණයට ඇතුලත් වන නිලධාරිණියක් තමයි චූලනී මහත්මිය. **"** යනුවෙන් සංශෝධනය විය යුතුය.

## <u>02.ගරු සභාපතිතුමිය විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>

**02.1 -**2022.08.12 සිට 2022.09.18 දක්වා සතිකයකට දින තුනක් වන සේ සකස් කරන ලද වීථි පහන් නඩත්තුව සම්බන්ධ කාලසටහන ඔබතුමන්ලාගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරනවා. ඔබතුමන්ලා සියළුදෙනාටම එහි පිටපත් ලබා දී ඇති. ඒ අනුව ඔබතුමන්ලාගේ කොට්ඨාශයට පැමිණීමට නියමිත දිනයට පෙර අක්‍රීය වී ඇති වීථිපහන් පිළිබඳව තොරතුරු ලබාදෙන්න. ඔබතුමන්ලා හෝ ඔබතුමන්ලාගේ නියෝජිතයෙක් සම්බන්ධ වෙන්න. ඉන්ධන පිරිමහගෙන මේ කටයුත්ත සාර්ථකව ඉටුකිරීමට ඔබතුමන්ලාගේ උපරිම සහයෝගය ලබාදෙන ලෙස මා සියළු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

**03.** **<u>ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.</u>**

**03.1** **<u>බෝයවලාන පොලිස් ස්ථානය පිහිටි ඉඩම ශ්‍රී ලංකා පොලීසිය වෙත පවරා දීම.</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අංක 1028 - නැබඩවතුර ග්‍රාම නිලධාරී වසමේ අනුරේඛන අංක 2022/05 හි කැබලි අංක Aඉඩමේ අලව්ව බෝයවලාන පොලිස් ස්ථානය පිහිටා ඇති බවත් එම ඉඩම ශ්‍රී ලංකා පොලීසිය වෙත පවරා දීම සඳහා එකඟතාවය ලබා දෙන ලෙසත් ඉල්ලීමක් කරමින් අදාල අනුරේඛනයේ පිටපතක් ද සහිතව අලව්ව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් ලිපියක් යොමු කර තිබෙනවා . ඒ සඳහා එකතගාවය ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අදහස් පල කිරීමටත් අවස්ථාව ලබා දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ පොලිස් ස්ථානය ඉදිකිරීමට සැලසුම් කරන අවස්ථාවේ සභාවක් විදියට අපව දැනුවත් කලේ නෑ. ගමේ ජනතාව පවා පොලිස් ස්ථානයක් ඉදිකිරීමට යන බව දැනගත්තේ එම ස්ථානය එළිපෙහෙළි කරන විටයි. ඒ වගේම නැබඩවතුර ග්‍රාමයේ ජනතාව පත්වී ඇති අපහසුතාව පිළිබඳව පවසා සියළුම ස්වේච්ඡා සංවිධාන විසින් ප්‍රාදේශීය ලේකම්තුමියට මේ පිළිබඳව දැනුවත් කලා. සභාවටත් අපි ඒ පිළිබඳ දැනුවත් කලා. පොලීසිය ස්ථාපිත කිරීම සම්බන්ධව කාගේවත් විරුද්ධත්වයක් නෑ. නමුත් මෙය තමයි දීර්ඝ කාලයක් මුළුල්ලේ ගමේ ජනතාවට තිබූ ග්‍රාම ලේකම් කාර්යාලය.එමෙන්ම මෙය ගමේ ජනතාවට තිබුණ පොදු ස්ථානයක්. වෙන කිසිම පොදු ඉඩමක් මේ ගමේ නෑ. ඒ පිළිබඳව අවධාරණය කරලා ප්‍රාදේශීය ලේකම්තුමියට ලිපි යොමු කලා. නමුත් ඒ සඳහා කිසිම පිළිතුරක් ලැබුනේ නෑ. අපිට ඉඩම් කැබැල්ලක් දෙනවා කියලා ප්‍රාදේශීය ලේකම්තුමිය වාචිකව කියා තිබෙනවා. නමුත් තාම ලබා දීලා නෑ. මෙසේ ආයතනයකට ඉඩම් කැබැල්ලක් ලබා දෙන විට පළාත් පාලන ආයතනයෙන් විමසීමක් කරලායි ඉඩම ලබා දෙන්නේ. මීට පෙර මේ පිළිබඳ දැනුවත් කලානම් අපිට මේකට මැදිහත්කරුවෙක් ලෙස ක්‍රියා කරන්න තිබුනා. මේ ඉඩම නිරවුල් කල යුතුයි. මේ සඳහා අනුමැතිය ලබා දීමට පෙර ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් විමසීමක් කර පොදු ජනතාවගේ යහපත පිණිස ඉඩම් කැබැල්ලක් මෙම ස්ථානයේ වෙන් කලාද යන්න විමසා එයට ලිඛිතව පිළිතුරු ලබා දුන් පසු මේ පිළිබඳ සාකච්ඡා කර එකඟතාවය ලබා දීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පසුගිය කාලයේ ප්‍රාදේශීය ලේකම් විදියට කටයුතු කල නිලධාරීන් පැහැදිලි අවබෝධයකිනුයි ප්‍රාදේශීය සභාවත් සමඟ කටයුතු කලේ. හැම වෙලාවේම සභාවෙන් ඉල්ලීම් කර සභාවේ මහජන නියෝජිතයින් අනුමැතිය ලබා දුන්නට පසුවයි එය ක්‍රියාත්මක කලේ. කිසිම අවස්ථාවක මහජන නියොජිතයන් සමඟ ප්‍රශ්න ඇතිකරගත්තේ නෑ. මොකද මහජන නියෝජිතයා මේ සභාවට ගේන්නේ එයාලගේ පුද්ගලික මතවාද නොව පොදු ජනතාවගේ ප්‍රශ්ණයි කියලා එම නිලධාරීන් දැනගෙන හිටියා. එදා වැත්තෑව මැතිතුමා මේ ඉඩම වෙන්කලේ ජනතාවගේ පොදු පහසුකම් සඳහායි. එතුමා අවුරුදු 100 ක් විතර ඉදිරියට දැකලයි මේ තීරණය ගත්තේ. එහෙම බලලා එදා ඒ ගත්ත තීරණයයි අභියෝගයට ලක් කරලා තිබෙන්නේ. එසේ කරලා අවසාන මොහොතේ ඉල්ලනවා මේකට අනුගත වෙන්න කියලා. ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ජනතාවගේ සුභසිද්ධිය වෙනුවෙන් කටයුතු කරන පළාත් පාලන ආයතනය දැනුවත් නොකර මේ කටයුත්ත ඉටු කරන්න එතුමිය උත්සාහ කරනවා. ඒ නිසා පොදු ජනතාවගේ පොදු අවශ්‍යතා ඉටුකිරීමට මිනුම් කටයුතු සිදුකර වෙන් කල ඉඩම පිළිබඳ ස්වේච්ඡා සංවිධාන වලට හා මේ සභාවට ලිපි ඉදිරිපත් කලායින් පසුවයි මේ කටයුත්තට එකගතාවය ලබා දිය යුත්තේ කියලා මම මේ ගරු සභාවට යෝජනාකරනවා. එසේ නොවුනහොත් සෑම ගරු මහජන නියෝජිතයන්ගේ ගෞරවයට හා අභිමානයට බරපතල කැලලක් සිදු වෙනවා.

නැබඩවතුර ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීම අනුව සමිති ශාලාව සෑදීමට අවශ්‍ය භූමිය මැන වෙන්කර මේ ගරු සභාවට සහ ස්වේච්ඡා සංවිධාන වලට දැනුම්දෙන තුරු මේ සම්බන්ධව මේ සභාවේ තීන්දුවක් ගන්නවා නම් මම ඒකට විරුද්ධයි.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපේ සභාවේ අනුමැතියකින් තොරව ප්‍රාදේශීය ලේකම්තුමියගේ තනි තීරණයකිනුයි මෙම ස්ථානයේ පොලීසිය ස්ථාපිත කිරීමට අනුමැතිය ලබා දීල තිබෙන්නේ. මේ පොලීසිය විවෘත කරන අවස්ථාවේත් ප්‍රාදේශීය සභාවේ සභාපතිට හෝ මන්ත්‍රී මණ්ඩලයට දැනුම් දීමක් කලේ නෑ. එතුමියට මේ ගැටළුව විසඳගන්න අවශ්‍ය නම් නැවත බිම් මට්ටමට යා යුතුයි. අපේ ඉල්ලීමට අනුව පොදු කටයුතු වලට තැනක් වෙන් කරලා දෙනවා නම් අපි කැමතියි. ඒ සඳහා අනුමැතිය ලබා දෙන්න. මේක විසඳගන්න අවශ්‍ය නම් ප්‍රාදේශීය මට්ටමේ ඉන්න නිලධාරීන්, ගම් වල ඉන්න ස්වේච්ඡා සංවිධාන වල නිලධාරීන් ඒකාබද්ධ කරගෙන අපේ සභාවේ සභාපතිතුමිය ඇතුළු ඒ ප්‍රදේශයේ සිටින අපේ මන්ත්‍රීවරු එක්ක සාකච්ඡා කර මේකට අවසන් තීන්දුවක් ගත යුතුයි. නැතුව පොලීසියට අපි මෙය පවරාදෙන්න තීන්දුව ගත්තොත් නීත්‍යානුකූලව කවුරු හෝ පෙත්සම් කරුවෙකු ඉදිරිපත් වුවහොත් අපි මේ සභාවටත් වගකියන්න වෙනවා, ඇයි මේකට මේ අවසරය දුන්නේ කියලා. මෙය නිවැරදි කරගන්න නම් අපේ සභාවත් ප්‍රාදේශීය ලේකම්තුමියත් එක්ව සාකච්ඡා කර තීන්දුවක් ගන්නවා නම් හොඳයි කියාල එතුමියට දන්වන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශීය ලේකම්තුමිය මෙම ඉඩම පොලීසියට පවරලා දුන්නේ ප්‍රදේශයේ මහජන නියෝජිතයන්ගෙන් හෝ ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධාන වලින් විමසලා නොවෙයි. එතුමියගේ තනි කැමැත්තටයි. අපි හැම වේලාවේම මහජනතාවගේ පැත්තේ සිටිය යුතුයි. මගේ අදහසට අනුව නැබඩවතුර ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය කරන සේවා පියස සකස් කිරීමට අවශ්‍ය භූමියක් හා සේවා පියසක් හදන වැඩපිළිවෙලක් ප්‍රාදේශිය ලේකම්තුමිය නිශ්චිත තීරණයක් ගෙන නීත්‍යානුකූලව අපිට යෝජනා කර එවන තුරු අපේ මේ සභාව මේ සඳහා විරුද්ධයි කියලා මම ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශීය ලේකම්තුමියගේ ක්‍රියා කලාපය හා එතුමියගේ නිලධාරීන්ගේ ක්‍රියාකලාපය පිළිබඳව අවධානය යොමුකල යුතුයි. අබ්බෝව ගමේ මේ වන විට පෝෂ්‍යදායී ආහාර මල්ල හා රු. 5000 දීමනාව බෙදා දෙන්නේ කිසිම විනිවිද භාවයකින් නොවෙයි. මෙය ලබාදෙන්නෙ ඒ ප්‍රදේශයේ සිටින රාජ්‍ය නිලධාරීන්ගේ හිතෛෂී පුද්ගලයන්ටයි. මේ සඳහා විධිමත් වැඩපිළිවෙලක් අපි මේ මොහොතේ සෑදිය යුතුයි. ප්‍රාදේශීය ලේකම්තුමිය මේ පිළිබඳ විධිමත් වැඩපිළිවෙලකට නොයන බව අවශ්‍ය ආයතන වලට දන්වා හෝ මේ සඳහා විසඳුමක් ලබා ගත යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සභාව දැනුවත් කරලා තිබෙනවා මේ සඳහා ප්‍රතිපාදන 2022 වර්ෂයේ ලබා දීමට සැලසුම් කරලා තිබෙනවා කියලා. ඒ කියන්නේ අපේ සභා යෝජනාවට ප්‍රතිචාරයක් ලැබිලා තිබෙනවා. නමුත් ඉඩම පිළිබඳ නිරවුල්තාවයක් තාම ලැබිලා නැහැ. ඒ වගේම පොලීසිය හිතනවා පොලීසිය ස්ථාපනය කලාට සභාව විරුද්ධයි කියලා. නමුත් මේ සභාවේ කිසිදු මන්ත්‍රීවරයෙක් ඒ සඳහා විරුද්ධ නෑ. මේ සඳහා ගෙන ගිය ක්‍රමවේදයයි වැරදි. ගමේ පොදු කටයුතු සඳහා ස්ථානයක් අවශ්‍යයි. එම නිසා සිදු වී ඇති දෙය පිළිබඳව අපි පොලීසිය දැනුවත් කල යුතුයි. ඒත් එක්කම ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් අවස්ථා ගණනාවක අපිට යොමු කල එම ලිපි වල පිටපත් මා හට ලබා දෙන්න කියලා කාරුණිකව ඉල්ලා සිටිනවා. ප්‍රදේශවාසීන් ඉදිරි කාලයක මානව හිමිකම් උල්ලංඝණය කිරීම පිළිබඳ අධිකරණයේ පිහිට පතනවා නම් එම ලිපි වැදගත් වේවි. මහජන නියෝජිතයෙක් හැටියට මට වගකීමක් තිබෙනවා ඒ පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමට. මෙය පවුල් 600 ක පමණ මානව හිමිකම් උල්ලංඝණය කිරීමක්.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

ගරු මන්ත්‍රීවරුනි, මේ කාරණය මේ සභාවේ කිහිප අවස්ථාවකදීම සාකච්ඡා වූ ගැටළුවක්. මේ පිළිබඳව අභාවප්‍රාප්ත සන්ධ්‍යා කුමාර සභාපතිතුමාගේ කාලයේ අපි සියළු දෙනා කතා කලා. ඉන්පසු උප සභාපතිතුමා සභාපති ධූරයේ වැඩ බලන විටත් මේ සම්බන්ධයෙන් මේ සභාවේ දීර්ඝව කතා කලා. එහිදී කොට්ඨාශය භාර ගරු මහජන නියෝජිතයන් දෙදෙනාම ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් අදහස් පලකරමින්, එතෙක් ප්‍රදේශයේ මහජනතාවගේ පොදු කටයුතු කල ස්ථානය ප්‍රදේශයේ කිසිදු පාර්ශවයක එකඟතාවයක් හෝ දැනුවත්වීමක් නොමැතිව හදිසියේම එම ස්ථානයේ පොලීසිය ස්ථාපිත කිරීම පිළිබඳව විරෝධතාවය පල කරමින් අදහස් පලකළ අතර සභාවේ සියළු මහජන නියෝජිතයින් එම අදහස් ඒකමතිකව පිළිගත්තා. ඒ අනුව අපේ උප සභාපතිතුමා මේ සම්බන්ධයෙන් ලිපි මගින් ප්‍රාදේශිය ලේකම්තුමියව දැනුවත් කළා. ඒ වගේම කොට්ඨාශය නියෝජනය කරන අපේ ගරු මන්ත්‍රිතුමන්ලා දෙපලම ඒකාබද්ධ යෝජනාවක් ගෙනෙමින් නැබඩවතුර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ රාජ්‍ය නිලධාරීන් සඳහා කාර්යාල සංකීර්ණයක් සහ ශාලාවක් ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් සහ ප්‍රතිපාදන ලබාදෙන ලෙසට මහ සභාවට යෝජනාවක් ඉදිරිපත් කලා. සභාව ඒකමතිකව මෙය අනුමත කලා. නොවැම්බර් මාසයේ එම යෝජනාව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට හා අනෙකුත් ආයතන වලට පිටපත් සහිතව අපි යවා තිබෙනවා. ඉන් පසු මාර්තු 25 වන දා එම යෝජනාව සම්බන්ධයෙන් ඉදිරි කටයුතු ඉටුකරන බවට අප වෙත ලිපි මගින් දැනුවත් කළා. අපේ ගරු මහ සභාව නියෝජනය කරන සියළු මහජන නියෝජිතයින් අදහස් පල කරමින් කියා සිටියේ පොලීසිය එම ස්ථානයේ පිහිටුවීම සම්බන්ධයෙන් කිසිදු විරෝධතාවයක් නැතත් මේ සඳහා ගෙනගිය ක්‍රමවේදය නිවැරදි නොවන බවයි. එමෙන්ම ප්‍රදේශය නියෝජනය කරන රාජ්‍ය නිලධාරීන්ට ප්‍රදේශයේ ජනතාවගේ රාජකාරී කටයුතු ඉටුකිරීමටත් ජනතාවගේ පොදු කටයුතු සඳහා භාවිතා කිරීමටත් ප්‍රමාණවත් ගොඩනැගිල්ලක් ඉදිකරගැනීමට අවශ්‍ය භූමි ප්‍රමාණය මෙම කොටසින් වෙන්කර එම ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීමට අවශ්‍ය කටයුතු ඉටුකරන ලෙසයි. ඒ අනුව ඔබතුමන්ලා සඳහන් කළ ආකාරයට ඒ සඳහා අවශ්‍ය කටයුතු ඉටුකරන්නේ නම් මේ සඳහා එකඟතාවය ලබා දිය හැකි බවට අපි ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ස්වේච්ඡා සමිති 10 ක් මේ ගමේ තිබෙනවා. අඩුම තරමින් මේ සමිති වලට පිළිතුරක්වත් යොමු කර නෑ.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

ස්වේච්ඡා සමිති සියල්ලෙන් ලිපි ඉදිරිපත් කළ ද ප්‍රාදේශිය සභාව යනු ඒ සියල්ල නියෝජනය වන තැනයි. ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයන් 28 දෙනාගේම එකඟතාවයෙන් අමාත්‍යාංශවලට ලිපි ඉදිරිපත් කර තිබෙනවා. අමාත්‍යාංශයත් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. නිල පියස සඳහා මුදල් වෙන් කර දෙන ලෙස මා විසින් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට 2021.11.22 දින ඉඩමේ සම්පූර්ණ තොරතුරු සහිතව ලිපියක් යොමු කලා. ඒ අවස්ථාවේ අලව්ව ප්‍රාදේශීය ලේකම් විසින් වාර්තා කර ඇති ආකාරයට කුරුණෑගල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත ලිපියක් යොමු කර ඇති බවත්, සේවා පියස සඳහා ප්‍රවේශ මාර්ග පහසුකම් සහිතව පර්චස් 20 ක ප්‍රමාණයක් ලබා දිය හැකි බවත් 2022.03.25 දිනැති ලිපිය මගින් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ඩී.ඩී.සී. අතුකෝරල මැතිතුමා විසින් පිළිතුරු ලිපිය අප වෙත යොමුකර තිබුනා. තවද 2022 වසරේ නිල පියස ඉදි කිරීම සඳහා යෝජනා කර දත්ත පද්ධතියට ඇතුලත් කර ඇති බවට අලව්ව ප්‍රාදේශීය ලේකම් විසින් වාර්තා කර ඇති බව එම ලිපියෙහි සඳහන් කර තිබුනා.

ඒ වගේම මන්ත්‍රීවරුත් ඒ අයගේ මුදල් ලබා දෙන්න කැමැති වුණා. අපි සභාවක් හැටියට හිටපු සභාපතිතුමාලත් මමත් අපේ වගකීම ඉෂ්ට කරලා තිබෙනවා. ඒ අමාත්‍යාංශ වලිනුත් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ජනතාවගේ පොදු කටයුතු සඳහා මේ කොටස සභාවට ලබා දෙන්න කියලා ඉල්ලීම් කර ඒ සඳහා එකඟ වන්නේ නම් පොලිසිය සඳහා අදාළ කොටස ලබාදීමට අපි එකඟතාවය ලබා දෙමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සභාව නොසලකා කටයුතු කිරීම සම්බන්ධව මේ සභාවේ අප්‍රසාදය පළ කරනවා කියලා විෂය භාර අමාත්‍යතුමාට සහ ස්වදේශ කටයුතු

අමාත්‍යාංශයට ලිපියක් යැවිය යුතුයි. එමෙන්ම තොරතුරු දැනගැනීමේ පනත යටතේ තමන්ගේ කොට්ඨාශයේ මෙම වියළි සලාක ලබා දුන් අය පිළිබඳව තොරතුරු ලබා ගන්නා ලෙසට මේ සභාවේ ගරු මහජන නියෝජිතයන් 28 දෙනාගෙන්ම මම ඉල්ලීමක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**

ගරු සභාපතිතුමියනි, වියළි සලාක සහනාධාරය ලබා දෙන විට අපේ කොට්ඨාශයේ ජනතාවට අසාධාරණකම් වෙලා තිබෙනවා. ඒ වගේම සමෘද්ධි සහනාධාරය ලබා දෙන්නේ ඉස්වැටිය සමෘද් බැංකුවේ. මේ ප්‍රදේශයේ ජනතාව එතනට පාන්දර දෙකට පමණ යනවා නොම්මර ගන්න කියලා.නොම්මර 50 ක් ලබා දෙනවා. ඒ ගියත් සමහරවිට නොම්මරයක් ලබාගැනීමට හැකියාවක් ලැබෙන්නේ නෑ. මේ පිළිබඳව මම එතුමියට කතා කලා. වසම් මට්ටමෙන් හරි මෙය සඳහා නිසි ක්‍රමවේදයක් හදන්න හෝ නැතිනම් වසමට පැමිණ සමෘද්ධි සහනාධාරය ලබා දෙන්න කියලා. ඒ සඳහා ද එතුමිය නිසි ක්‍රියාමාර්ගයක් ගත්තේ නෑ. ඒ වගේම මෙම ඉඩම සම්බන්ධ ප්‍රශ්නයේදී සේවා පියස සඳහා ඉඩමක් ලබා දුනහොත් පොලිස් ස්ථානය සඳහා අවශ්‍ය එම කටයුතු සිදු කර දීමට එකඟ වන බව මම ප්‍රකාශ කරනවා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, රජයෙන් ලබාදෙන මේ සහනාධාර ගැන දැන ගැනීමට අපටත් අයිතියක් තියනවා. කොරෝනා වසංගත කාලේ මන්ත්‍රීවරු සියලු දෙනා එකතු වෙලා කමිටුවක් ලෙස ඉඳලා පක්ෂ භේදයකින් තොරව එම කටයුතු සම්බන්ධීකරණය කලා. දැන් එහෙම එකක් නෑ. ඒ නිසා අපි සභාවක් ලෙස මැදිහත් වී, කොට්ඨාශ මට්ටමින් එම සහනාධාර ලබා දුන් අය පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් ලබා ගන්න පුළුවන් නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මම ග්‍රාම නිලධාරි මහතකුට කතා කළ අවස්ථාවක එතුමා කිව්වා කුඹුරු නොමැති අයටයි ඒ සහනාධාර ලබා දුන්නේ කියලා. එහෙත් එසේ නොවන සමහර අයට මේ සහනාධාරය ලබා දීල තිබුණා. මහජන නියෝජිතයා අතහැරලා නිලධාරිවාදය මතු වුනාමයි මෙහෙම වෙන්නේ. මහජන නියෝජිතයන් මේකට සම්බන්ධ කර ගන්නවා නම් මෙය සාධාරණව කල හැකියි. මේ ඉඩම සම්බන්ධ ප්‍රශ්නයේදී අපට ගැටලුවක් තිබෙනවා. ඉතා වේගවත්ව මේ පොලිසියේ ඉඩම මැන තිබෙනවා. ඒ මැනීම ඇතුලේ මේ ජනතාවගේ ඉඩම මැනීමට දාගත්තේ නැත්තෙ ඇයි කියල ප්‍රශ්නයක් තිබෙනවා. පුද්ගලික මිනින්දෝරුවෙකු යොදවා මේ ඉඩම මැන ගැනීමට අවසර ලබා දෙන්න කියලා ජයතිලක මන්ත්‍රීතුමා ලිඛිතව ඉල්ලන්න. නැත්නම් මේවා සිදු කරන්න වෙන්නේ නෑ.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

උප සභාපතිතුමා කියූ ආකාරයට මේ සඳහා වෙනම වේලාවක් යොදාගෙන සාකච්ඡා කිරීමට වැඩි අවධානයක් යොමු කරනවා. ඒත් එක්කම අපි ප්‍රාදේශීය සභාව ලෙස ගත යුතු පියවර අරගෙන, අමාත්‍යාංශයෙනුත් අදාළ තැන්වලට යොමු කරලා තිබෙනවා. අවසාන පියවර තමයි සිදුවෙලා නැත්තේ. අපට යොමු කර ඇති ලිපියෙන්ම පොලිසිය සඳහා වෙන්කර ඇති කොටස හැර අනික් කොටස මේ සඳහා වෙන් කරන බව පවසා ලිපිය යොමු කළා නම් මෙතැන ගැටලුවක් නෑ. අපේ ඉල්ලීමට අදාළ භූමි ප්‍රමාණය ලබා දෙන තෙක් මේ සඳහා සභාව එකඟ වන්නේ නැහැ කියන එකයි ඔබතුමාලා ගත්ත තීන්දුව. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කියන්නෙත්, ප්‍රාදේශීය සභාව කියන්නෙත් මහජනතාවගේ ප්‍රශ්න විසඳන තැන.මහජනතාවගේ අයිතීන් පිළිබඳ තීරණ ගැනීමේදී දුරකථන මාර්ගයෙන් නොව සාකච්ඡා මාර්ගයෙන් තීන්දු තීරණ ගත යුතුයි. සාකච්ඡා මාර්ගයෙන් තීන්දු තීරණ ලබා ගන්නා තෙක් අපට මේවට එකඟ වෙන්නත් බෑ.

ඒ අනුව නැබඩවතුර ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය කරන සේවා පියස සකස් කිරීමට අවශ්‍ය භූමියක් හා සේවා පියසක් හදන වැඩපිළිවෙලක් සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම්තුමිය නිශ්චිත තීරණයක් ගෙන නීත්‍යානුකූලව සභාවට යෝජනාකර එවන තුරුඅංක 1028 - නැබඩවතුර ග්‍රාම නිලධාරී වසමේ අනුරේඛන අංක 2022/05 හි කැබලි අංක A ඉඩමේ අලව්ව බෝයවලාන පොලිස් ස්ථානය නිසි ක්‍රමවේදයෙන් බැහැර යමින් දැනට ස්ථාපිත කර ඇති ඉඩම ශ්‍රී ලංකා පොලීසිය වෙත පවරා දීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ලබා දිය නොහැකි බවට ඒකමතිකව සභා සම්මත විය.

**03.2 <u>2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 18 (2) වගන්තිය යටතේ විගණන ගාස්තු තීරණය කිරීම.</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2020 වර්ෂයට අදාලව අප සභාව විසින් ගෙවිය යුතු රු. 172,200.00 ක විගණන ගාස්තු පිළිබඳව අප ආයතනයේ එකඟතාවය හා නිර්දේශ කඩිනමින් වාර්තා කරන ලෙස දන්වමින් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ලිපියක් ඉදිරිපත් කරල තියනවා. ඒ සඳහා එකගතාවය ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේවා රජයේ ආයතන. මෙය හරි අසාධාරණ වැඩක්. නමුත් අනෙක් ආයතනත් ගෙවනවා නම් අපිටත් ගෙවීමට සිදුවෙනවා. වෙනත් ප්‍රාදේශීය සභා සමඟත් සාකච්ඡා කරලා අවශ්‍ය ගෙවීම් කටයුතු සිදු කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, විගණනය කිරීමේ අයිතියක් තිබෙනවා. රටක ආයතන විගණනය කිරීම අවශ්‍යයි. එහිදී විගණනය කිරීමේ දෙපාර්තමේන්තුව ඒ සඳහා යන වියදම් අයවැය ලේඛනය හරහා වෙන් කරගත යුතුයි. මගේ පුද්ගලික මතය නම් එම මුදල අප සභාව විසින් ගෙවිය යුතු නැ කියන එකයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, රජයට සම්බන්ධ සියළු ආයතන විගණනය කරන්න විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් මේ ආයතනයට ප්‍රතිපාදන අනුමත කර තිබෙනවා. නමුත් මේ ආයතන විගණනය කරන විට යම් මුදලක් ගෙවීමට මෙම ආයතන බැඳිලා සිටිනවා. මම සිතන්නේ මෙය වැරැද්දක් නොවෙයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පවතින මහ සභාව කාරක සභාවක් බවට පත් කිරිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පවතින මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පවතින කාරක සභාව මහ සභාවක් බවට පත් කිරිමට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පවතින කාරක සභාව මහ සභාවක් බවට පත් විය.

ඉහත කාරක සභා අවස්ථාවේදී ලේකම්තුමිය විසින් විගණන ගාස්තු ගෙවීම පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ආයතන විගණනය කිරීම අවශ්‍යයි. මීට පෙර ද ගෙවීම් කල නිසා මේ විගණන ගාස්තුව ගෙවීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා. මීට පෙර අවුරුදු ගණනාවක් මේ සඳහා ගෙවීම් කරලා තිබෙනවා. කාරක සභා අවස්ථාවේදී ලේකම්තුමිය ඒ බව පැහැදිලි කලා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

ඔබතුමාලා සියළු දෙනාගේම අදහස් අනුව යෝජනාව ස්ථිර වුනා. අපි අවට සභාවලිනුත් මේ ගැන විමසුවා. එම ආයතනත් තර්ක විතර්ක වලින් පසුව අවසානයේ ගෙවීම් කිරීමට කැමති වෙලා තිබෙනවා. හැමෝම කියනවා වගේ විගණනයක් කිරීම අත්‍යාවශයයි.

ඒ අනුව 2020 වර්ෂයට අදාලව අප සභාව විසින් ගෙවිය යුතු විගණන ගාස්තුව වන රු. 172,200.00 ක මුදල ගෙවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**03.3<u>නායක පදවි උත්සවය සම්බන්ධවයි.</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

මහා විහාර වංශික, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ, දඹදෙණිය ප්‍රාදේශීය සංඝ සභා බල ප්‍රදේශයේ, දඹදෙණි හත්පත්තුවේ ප්‍රධාන අධිකරණ සංඝ නායක පදවියෙන් පිදුම් ලැබූ බවත්, නායක පදවි ප්‍රාප්ති පිළිගැනීමේ උත්සවය 2022.09.04 දිනට පැවැත්වෙන බවත්, ඒ වෙනුවෙන් තොරණක් ඉදි කිරීම සඳහා සහයෝගය හා අවශ්‍ය කටයුතු ඉටු කර දෙන ලෙස ඉල්ලීමක් කරමින් පූජ්‍ය මුංවත්තේ වංසානන්ද හිමිවිසින් ඉදිරිපත් කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ ස්වාමීන් වහන්සේට මෙම පදවිය ලැබීම පිළිබඳව අපි ප්‍රදේශවාසීන් ලෙස සතුටට පත්වෙනවා. උන්වහන්සේ මේ පදවි ප්‍රාප්ත උත්සවය වෙනුවෙන් උදව් කීපයක් ඉල්ලලා තිබෙනවා. උන්වහන්සේ ඉල්ලීම් කරලා තියෙන්නේ තොරණක් ඉදිකර ගැනීමට හා ප්‍රචාරක රථයක් ලබා ගැනීමටයි. බුද්ධ පුත්‍රයෙක් හැටියට මේ ප්‍රදේශයේ සමාජ කටයුතු සිදු කරන විට උන්වහන්සේ උපරිම දායකත්වයක් ලබා දෙනවා. උන්වහන්සේ ඉදිකරන ගොඩනැගිලි පවා ඉතිරි වන්නේ මේ ප්‍රදේශයේ බෞද්ධ ජනතාවටයි. උන්වහන්සේට මේ පදවිය ලැබීම පිළිබඳව මේ සභාවේ ගෞරවය ප්‍රකාශ කරන අතර උන්වහන්සේගේ ඉල්ලීමට අනුව සභාවට හැකි ආකාරයෙන් අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙසට ගරු සභාපතිතුමිය ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම ගරු සභාපතිතුමියගේ මූලිකත්වයෙන් මේ අවශ්‍ය කටයුතු ඉටු කර දීම සුදුසු යැයි ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි බෞද්ධයන් ලෙස අලව්ව පාළම ළඟ ඇති විහාරස්ථානය දකින විට හරි ආඩම්බරයක් දැනෙනවා. අපි සබරගමුවෙන් වයඹට එකතුවෙන්නේ බෞද්ධ පරිසරයකටයි. මේ විහාරස්ථානයේ වැඩ වාසය කරන මේ ස්වාමීන් වහන්සේට සංඝනායක පදවිය ලැබීම අපටත් ආඩම්බරයක්. අපි බෞද්ධයෝ විදියට මේ උත්සවයට අවශ්‍ය සහයෝගය ලබාදීම සුදුසුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුවට යන මාර්ගයේ වයඹට පිවිසෙන ප්‍රධාන දොරටුව අලව්වයි. එම ස්ථානයේ ඇති විහාරස්ථානයේ වැඩ වාසය කරන මෙම ස්වාමීන් වහන්සේට තනතුරු නාමයක් ලැබීම අපිටත් ගෞරවයක්. මේ උතුම් කර්තව්‍යය සඳහා අපට හැකි ආකාරයෙන් සහයෝගයක්, දායකත්වයක් ලබා දීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අද එම ස්ථානය වටිනා ස්ථානයක් බවට පත්වෙලා තිබෙනවා. එම ස්ථානය වයඹට පිවිසුමක් වන ස්ථානයක් ලෙස වටිනාකමක් දී තිබෙනවා. අපි එය අගය කරනවා. නමුත් මෙම උත්සව අවස්ථාව සඳහා ප්‍රචාරක රථයක් ලබා දීම සහ කොඩි කණු සහ කොඩි ටික ලබා දීම කලහැකියි. නමුත් තොරණ ඉදි කිරීමේදී වියදම් දරණ ආකාරය සහ එහි ප්‍රමාණය පිළිබඳව අප සභාවට දැරිය හැකි මට්ටමට අනුව තීන්දු ගැනීමට සිදු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රචාරක රථය හා බැකෝ යන්ත්‍රය ලබා දෙන ලෙස ඉල්ලීමක් කර තිබෙනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

නැවත ඒ පිළිබඳව සාකච්ඡාවක් පවත්වන බව පැවසුවා. එහිදී ඔබතුමන්ලා එකඟ වූ වැඩ කොටස් ටිකයි භාරගැනීමට සිදුවන්නේ. ඒ නිසා අපට කරන්න හැකියාවක් තිබෙන වැඩ පිළිබඳව අපි එකඟතාවයක් අරගෙන සිටින එක හොඳයි

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, උන්වහන්සේ තොරණ, පරිසරය පිරිසිදු කරගැනීමට JCB යන්ත්‍රය ලබා ගැනීම හා ප්‍රචාරක රථය මෙන්ම සියලුම මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වය ඉල්ලා තිබෙනවා. මේවා ලබාදීම සුදුසුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය**

ගරු සභාපතිතුමියනි, මෙම විහාරස්ථානය ප්‍රදේශයේ පවතින ආගමික ස්ථානයක් ලෙසත්, දියුණුවෙමින් පවතින ස්ථානයක් ලෙසත් බෞද්ධයන් ලෙස අපි අගය කළ යුතු ස්ථානයක්. එමෙන්ම උන්වහන්සේට තනතුරක් ලැබිලා තිබෙනවා. ඒ නිසා අපි උන්වහන්සේට අවශ්‍ය සහයෝගය ලබා දීමත්, සභාවෙන් වෙන් කල හැකි ප්‍රතිපාදන ප්‍රමාණයකුත් ලබාදීම සුදුසුයි කියලා මම හිතනවා. ඒ වගේම යෝජනාව ස්ථිර කිරීමට මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ගරු සභාවේ මහජන නියෝජිතවරුන්ගෙන් බලාපොරොත්තු වෙන්නේ ඉහත ඉල්ලීම් කළ දේ පමණක් ද යන්න මම උන්වහන්සේගෙන් විමසුවා. සභාවක් ලෙස ඊට වඩා වියදම් කිරීමට අපට හැකියාවක් නොමැති බවත් මම උන් වහන්සේට පැවසුවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව පාලම අසල ඇති අලව්ව බෝධිරාජ බෞද්ධ මධ්‍යස්ථානයේ විහාරාධිපති පූජ්‍ය මුංවත්තේ වංසානන්ද හිමි, මහා විහාර වංශික, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ, දඹදෙණිය ප්‍රාදේශීය සංඝ සභා බල ප්‍රදේශයේ, දඹදෙණි හත්පත්තුවේ ප්‍රධාන අධිකරණ සංඝ නායක පදවියෙන් පිදුම් ලැබීම නිමිත්තෙන් 2022.09.04 දිනට යෙදී ඇති උත්සවය සඳහා පිවිසුම් මාර්ගයට අදාල තොරණ සකස් කර දීම, පන්සල් භූමිය සකස් කිරීමට JCB යන්ත්‍රය ලබාදීම, මාර්ග කම්කරු මහතුන් යොදවා පෙරහැර ගමන් මාර්ගය හා අදාල විවිධ ස්ථාන වල තණකොළ කපා දීම, ප්‍රචාරක කටයුතු සඳහා වාහනය දින දෙකක් ලබා දීම යන වැඩ කොටස් ඉටුකරදීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

**04.** <u>යථා පරිදි කල් දීඇති ප්‍රශ්න - නැත</u>

**05.** <u>යථා පරිදි කල් දී ඇති යෝජනා</u>

**(05-1)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/53 - 01** දරණ යෝජනාව</u>

දෛනික පදනම මත අප සභාවේ සේවය කරන ඒ.ඒ.එස්.ඕ.එම්. අලහකෝන් යන අයගේ ගිවිසුම් කාලය 2022.10.06 දිනෙන් අවසන් වන අතර ඔහුගේ සේවය තවදුරටත් සභාවට අත්‍යාවශ්‍ය වන බැවින් සේවා කාලය දීර්ඝ කර ගැනීමට මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත නම සඳහන් ඒ.ඒ.එස්.ඕ.එම්. අලහකෝන් යන අයගේ ගිවිසුම් කාලය 2022.10.06 සිට සිට තවත් මාස 06 කින් දීර්ඝ කර කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-2)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/53 - 02** දරණ යෝජනාව</u>

අලව්ව ප්‍රාදේශීය සභාව විසින් පාවිච්චි කර ඉවත් කරන ලද අබලි තත්වයේ පැවති භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 2022.07.12 දින පැවති මහා සභා තීරණ අංක 05.20 යටතේ අනුමත වීමෙන් පසු එම භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ කටයුතු 2022.07.28 දින සිදු කරන ලද අතර එදින භාණ්ඩ වෙන්දේසියෙන් රු. 361605.00 ක් (රුපියල් තුන්ලක්ෂ හැට එක්දහස් හයසිය පහක්) මුදලක් ලැබිණි. නමුත් මෙහිදී පහත සඳහන් අබලි භාණ්ඩ සඳහා මිල ගණන් ඉදිරිපත් නොවූ අතර එම භාණ්ඩ වෙන්දේසිකිරීමට නොහැකි විය.ඒ අනුව එම වෙන්දේසි නොවූ අබලි භාණ්ඩවල මිල ගණන් සංශෝධනය කර (අඩු කර) වෙන්දේසි කිරීමේ කටයුතු සිදු කිරීමට මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජිව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා. මමත් ඒ අවස්ථාවට සහභාගී වුනා. ඒ මිල ගණන් දාලා තිබුනේ උපරිම මිල ගණන් වලට. ඒ නිසා මේ භාණ්ඩ වෙන්දේසි වුනේ නෑ. එළියේ වෙළඳපලේ මිල ගණන් පිළිබඳව අවධානය යොමු කරලා එම මිලගණන් වලට අනුකූලව තක්සේරුවක් නොකලොත් නැවත මෙම භාණ්ඩ වෙන්දේසි කරන්න බැරි වෙනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අපි මේ සභාවේම මිල ගණන් තීරණය කරලා යෝජනා ස්ථිර කරගනිමු. ඔබතුමන්ලාම මිල ගණන් යෝජනා කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජිව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,ඔබතුමිය ගෙන ආ යෝජනාවට අනුව පහත සඳහන් මිලගණන් යටතේ එම අබලි භාණ්ඩ වෙන්දේසි කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

| අනු අංකය | භාණ්ඩ වර්ගය | කිව යුතු කාරණා | ප්‍රමාණය | පැවති තක්සේරු මිල (රු.) | |
|---|---|---|---|---|---|
| 01 | ලී ලියන මේස | පාවිච්චි කරන ලද අබලි තත්වයේ | 04 | එකක් 8000.00 | එකක් 4000.00 |
| 02 | කුෂන් යකඩ පුටු | ” | 03 | 800.00 | 400.00 |
| 03 | 8x4 ප්ලයිවුඩ් බෝඩ් | ” | 01 | 3000.00 | 1500.00 |
| 04 | ¼ කම්බි | ” | 15kg | යකඩ බරට 1 kg - 150.00 | යකඩ බරට 1 kg - 75.00 |
| 05 | ¼පට්ටන් (මුට්ටු කල කුෂන් පුටුවලින් ඉවත් කල) ඉතිරි කොටස | ” | | යකඩ බරට 1 kg - 150.00 | යකඩ බරට 1 kg - 75.00 |
| 06 | අහල් 1x9, අහල් 6x9 දොර පියන් (කැඩුණු) | ” | 03 | 1000.00 | එකක් 500.00 |
| 07 | ඇලුමිනියම් බෝර්ඩ් | ” | 02 | යකඩ බරට 150.00 | ඇලුමිනියම් බරට 1 kg - 150.00 |
| 08 | ඇලුමිනියම් ප්‍රේම්, ඇලුමිනියම් දොර | ” | 02 | 4000.00 | 2000.00 |
| 09 | අබලි තහඩු | ” | 30kg (දළ වශයෙන්) | තහඩු බරට 1kg - 100.00 | තහඩු බරට 1 kg - 50.00 |
| 10 | ගේට්ටු පියන් | ” | 05 | යකඩ බරට 1kg - 150.00 | යකඩ බරට 1 kg - 75.00 |
| 11 | උළු | ” | 7585 | කැටයක් 20.00 | කැටයක් 10.00 |
| 12 | කොටු දැල රහිත කුඩු (ප්‍රේම්) | ” | 05 | එකක් 500.00 | එකක් 250.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,මෙම මිල ගණන් කාර්මික නිලධාරීන්ගේ අධීක්ෂණයට යොමු කරනවා නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, පසුගිය වෙන්දේසියේදී, සතිපොළෙන් ඉවත්කරන ලද තහඩු වෙන්දේසියට දමා තිබුනා. නමුත් එම තහඩු අඩු ආදායම්ලාභී පවුල්වලට ආධාර ලෙස ලබා දෙන ලෙස ඉල්ලීමේ ලිපි ඉදිරිපත් කර තිබියදීත් ඒ ගැන සැලකිල්ලක් නොදක්වා වෙන්දේසියේ දැමීම පිළිබඳ මම කණගාටු වෙනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**
ඒ පිළිබඳ සොයා බලා ඊළඟ සභාවට හෝ කමිටුවකට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දෙන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, උළු කැටයක තක්සේරු මුදල රු. 10.00 ක් පමණ වන නිසා බල ප්‍රදේශයේ කවුරුන් හෝ මෙසේ ඉල්ලීම් කර තිබේ නම් එම ඉල්ලීම් පිළිබඳ සලකා බලා මේ සභාවේ තීරණයක් ගෙන එක් පුද්ගලයෙකුට රු. 10.00 මිලකට උළු 500 බැගින් එන ආකාරයට බෙදා දෙමු. එයට මේ කවුරුත් විරුද්ධ වෙන එකක් නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, විපක්ෂ නායකතුමා ගෙන ආ යෝජනාව ඉතාමත්ම හොඳයි. නමුත් එහි සංශෝධනයක් කරන ලෙස ඉල්ලා සිටිනවා. උළු 500 ක් එක ගෙදරකට ප්‍රමාණවත් නෑ. ඒ නිසා නිලධාරීන් මගින් සොයා බලා තීරණවලට අනුව ගෙවල් 03 ක් හෝ වහලය සම්පූර්ණයෙන් සෙවිලි කරනවා නම් හොඳයි. ගැලපෙන අය සඳහා ඒවා ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අපි ඒ පිළිබඳව ක්‍රියාත්මක වෙමු. මගේ අත්දැකීම් එක්ක බොහෝ අවස්ථා වල ඉල්ලන්නේ තහඩු. මොකද උළු සෙවිලි කිරීමට වැඩි ලී ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා. ලී සොයාගන්න එකත් අපහසුයි. නමුත් කවුරුන් හෝ ඉල්ලීම් කරනවා නම් ඒ අයට උළු ලබා දෙමු. කාටහරි යමක් ලබා දෙන එකයි අපිට කෙරෙන්න අවශ්‍ය වන්නේ.

ඒ අනුව ඉහත ඉදිරිපත් කරන ලද මිල ගණන් යටතේ එම අබලි භාණ්ඩ වෙන්දේසි කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(05-3)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/53 - 03** දරණ යෝජනාව</u>

2023 වර්ෂය සඳහා බදු පැනවීම සඳහා 2022.07.12 දින පැවති මහා සභාවේදී කොම්පෝස්ට් පොහොර අලෙවි කිරීමේදී සඳහන් මිල රු. 15 ක් ලෙසත් කොම්පෝස්ට් කිලෝ 1000 ක් මිලදී ගන්නා විට 25% ක වට්ටමක් ලබා දෙන බවත් සඳහන් කර යෝජනාව සම්මත කර ඇත. නමුත් මේ වන විට අප කොම්පෝස්ට් පොහොර විශාල වශයෙන් අතිරික්තයක් හෝ නොමැතිව අලෙවි වීම හේතුවෙන්එම 25% ක වට්ටම ලබා දීම අවශ්‍ය නොවන බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව කොම්පෝස්ට් පොහොර විශාල වශයෙන් ඉල්ලුමක් ඇති බැවින් හා  අලෙවි වීම ගැටලුවක් නොවීම හේතුවෙන් කොම්පෝස්ට් කිලෝ 1000 ක් මිලදී ගන්නා විට 25% ක වට්ටමක් ලබාදීම අවශ්‍ය නොවන බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-04)**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා විසින් කරනු ලබන අංක **06/53 - 04** දරණ යෝජනාව</u>

ගොවි ජනතාව විසින් වගා කරනු ලබන පොල්- පළතුරු ඇතුළු විවිධ බව බෝගයන්ගෙන් හරි අඩකටත් වඩා විනාශ කරනු ලබන දඬු ලේනුන්, රිලවුන්, වල් ඌරන්, ඉත්තෑවන් හා මොනරුන් වැනි සතුන්ගෙන් වන හානිය අවම කරවීම සඳහා විධිමත් වූ පොදු වැඩපිළිවෙලක් දීප ව්‍යාප්තව නොපමාව දියත් කරවීමට මධ්‍යම රජයේ කෘෂිකර්ම අමාත්‍යතුමා සහ වනජීවී අමාත්‍යතුමන් හා ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු දේශපාලන පක්ෂ නායකතුමන්ලාගේ අවධානයට යොමු කරවීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම යෝජනාව පසුගිය මහා සභා රැස්වීමේ අදාල න්‍යාය පත්‍රයට යොමුකර තිබුනත් එම අවස්ථාව වන විට අප රටේ උත්තරීතර පාර්ලිමේන්තුවේ ඇති වී තිබූ අස්ථාවරභාවය නිසා මෙම වැදගත් යෝජනාව අවධානයට ගැනීමට තරම් මානුෂික පසුබිමක් නොමැති බව පෙනී ගිය බැවින් එදින මා විසින් ඔබතුමියගෙන් කරන ලද ඉල්ලීම අනුව අද දින පැවැත්වෙන සභා රැස්වීමේ අදාල න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීමට කටයුතු කිරීම පිළිබඳ මාගේ ගෞරවනීය ප්‍රණාමය පුද කරන්න කැමතියි. ගරු සභාපතිතුමියනි මෙම යෝජනාව මීට පෙර සභා සැසි වාර කීපයකදීම මෙම සභාවට ඉදිරිපත් ව ඒකමතිකව සම්මත වී අදාල වගකිව යුතු ආයතන වලට හා පුද්ගලයන්ට යොමු කල ද සතුටුදායක පියවරක් නොගැනීම අපේ ගොවි ජනතාවගේ අභාග්‍යක් හා අවාසනාවක් ලෙස දකිනවා.

මේ වන විට අප සභා බල ප්‍රදේශයේ ගොවි ජනතාව පමණක් නොව දීප ව්‍යාප්තව ග්‍රාමීය ජනතාව හා ගොවි ජනතාව මෙම වගා හානි සතුන්ගේ ග්‍රහනයට නතු වෙලයි තිබෙන්නේ. ඒ ගැන අපි සියළු දෙනාම ඉතා හොඳින් දන්නවා. දැනට විවිධ විද්වතුන් හා බුද්ධිමතුන් අනාවැකි පල කරලා තිබෙනවා ඉදිරියේදී මහත් ලෙස ආහාර අර්බුදයකට අපේ රට පත්වෙන බව.

දැනට මෙම වන සතුන්ගෙන් වන වගා විනාශයට යම් සාධනීය විසඳුමක් ලබා දීමට හැකි වේ නම් අපේ රටට එතරම් ආහාර අර්බුදයක් ඇති නොවන බවයි මගේ වැටහීම. විශේෂයෙන්ම අපේ සභා බල ප්‍රදේශයේ ජීවත්වන ගොවි ජනතාවගේ වගාවන් අතර පොල්, පළතුරු, අල වර්ග හා එලවළු වගාවන් වලින් හරි අඩකටත් වඩා විනාශ කරන්නේ මේ වන සතුන්. මේ නිසා අපේ ගොවි ජනතාව අත් විඳින පාඩුව අනන්තයි, අප්‍රමාණයි. මෙම වන සත්ත්ව උවදුර එන්න එන්නම වැඩිවෙන බවක් තමයි අපි හැමදෙනාටම දැකගන්න අවබෝධ කරගන්න ලැබෙන්නේ. මේ විනාශය වැඩිවීමට මූලික හේතු කීපයක් බලපාලා තිබෙනවා.

එකක් තමයි සිදු වුන හා සිදු වෙන වන විනාශය, තවත් හේතුවක් තමයි මෙම සතුන්ගේ සීඝ්‍ර බෝවීම. උදාහරණයක් ලෙස ගත්තොත් දඬුලේනා වසරකට කීප අවස්ථාවක් පැටවු ප්‍රසූත කරනවා. පැටවු 3 ක් 4 ක් අතර ගණනක් එක් වරකට ප්‍රසූත කරනවා. වල් ඌරාත් එහෙමයි. 70 දශකයෙන් එහා මෙවැනි වගා විනාශයක් මෙම සතුන්ගෙන් තිබුනේ නැහැ. එයට ප්‍රධාන හේතුවක් ලෙස මම දකින්නේ එදා ගමක පතරොම් තුවක්කු හා බෙත් කොටන තුවක්කු 3 ක් 4 ක් එක ගමක තිබුනා.

ජනතා විමුක්ති පෙරමුණ 71 දී ඇතිකරන ලද මිලේච්ඡ කැරැල්ල නිසා ජනතා විමුක්ති පෙරමුනේ සහෝදරයින් විසින් කොටසක් පැහැරගත්තා. ඒ වකවානුවේ සමහර අවස්ථාවල අපි දුටුවා තුවක්කු අයිති අය එම තුවක්කුවෙන්ම වෙඩි තියා ඝාතනය කරලා තුවක්කු පැහැරගත් අවස්ථා.

ගම් වල තිබුන ඉතිරි තුවක්කු ටික තුවක්කු අයිති අයගේ සහ ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් පොලීසිය විසින් ලබා ගත්තා. එම තුවක්කු නැවත ලබා දීමක් සිදු වුනේ නෑ. දැන් ගම් වල තුවක්කු ඇත්තේ නෑ.

තුවක්කු ලබා ගන්නට කැමති අය ගම් වල සිටියත්, තුවක්කු ලබා ගැනීමට සුදුසුකම් වශයෙන් නීතියෙන් පනවා ඇති නිර්නායකයන් නිසා තුවක්කු ලබා ගැනීම අපහසු වී තිබෙනවා.

මේ නිසා අපේ ගොවි ජනතාව පත්ව ඇති ඉතා අවාසනාවන්ත තත්වයට නිසි ස්ථිරසාර විසඳුමක් නියත වශයෙන් ලබා දිය යුතු වෙනවා. අපි නියෝජනය කරන කුඩා මහජන ආයතනයකට මෙම ප්‍රශ්නයට විසඳුමක් ලබා දිය නොහැකියි. ඒ නිසා මධ්‍යම රජයේ අවධානයට යොමු කර මේ ප්‍රශ්නයට කාලෝචිත විසඳුමක් ලබා දිය යුතුමයි. ඒ නිසා මේ පිළිබඳ ඔබ සියළු දෙනාගේ අවධානය යොමු වේවායි ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ජ් යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ යෝජනාව ඉතාමත් කාලෝචිත යෝජනාවක්. අපේ ගම්වල වගා නිෂ්පාදනයෙන් 90% ක්ම මේ සතුන් තමයි පරිභෝජනය කරන්නේ. 1989 කලබල කාලේ ගම්වල තිබුනු තුවක්කු ආපසු ලබා ගැනීමත් සමඟ කැලෑවල සිටිය සතුන් ගම් වැදෙන්න පටන් ගත්තා. දැන් මෙය ඉතා බරපතල ප්‍රශ්නයක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ් චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,මේ යෝජනාව මීට පෙර වාර ගණනාවකදී සාකච්ඡා කලා. වදාව කියන්නේ අලව්ව බල ප්‍රදේශයේ ඉතාම සශ්‍රික ප්‍රදේශයක්. ඒ වගේම නුංගමුව ඉහළ කන්ද ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු සිදුකලා. නමුත් වන සතුන්ගෙන් වගාවලට සිදුවන හානිය නිසා දැන් මිනිසුන් ඒ කන්ද අතහැරලා පදිංචිය සඳහා පහළට එනවා. අතීතයේ ගම්වල දඩයම්කරුවො හිටියා. ඔවුන් නිසා පරිසරයේ සමතුලිතතාව ආරක්ෂා වුනා. තුවක්කු ආපසු ගැනීමත් මේ කාරණයට හේතුවක්. ගිනි අවි බලපත්‍රය ලබා දීමේ ඉඩම් සීමාවක් තිබෙනවා. මේ ඉඩම් සීමාව අපි අක්කරයකට හෝ අක්කර 1 ½ කට ගේන්න අවශ්‍යයි. එසේ කලහොත් ගම් වලට ගිනි අවි කිහිපයක් එනවා. එමගින් සතුන් ඝාතනය නොකලත් ගිනි අවියට බිය නිසා සතුන් ගම් වැදීම නවතිනවා. මේ ගිනිඅවි ලබා දීමේදී ඉඩම් සීමාව අඩු කරන්න කියලා අපි රජයට යෝජනා කල යුතුයි. ඒ වගේම අපෙනුත් වැරැද්දක් වෙලාතිබෙනවා. අතීතයේ වන ගහනයක් තිබුනා. ඒ නිසා වනසතුන් ගම් වැදීම අඩු වුනා. ඔවුන්ට ආහාර වනය තුලම තිබුනා. නමුත් මිනිසුන් විසින් වනාන්තර එළිපෙහෙලි කිරීම මේ ගැටළුව ඇති වීමට එක හේතුවක් වුනා.ඒ වගේම විදේශ ආධාර යටතේ සිදුකල වගා සංග්‍රාමයත් එක්ක මාරගල්කන්ද ප්‍රදේශයේ කැලෑ එළි කරලා විදේශ ආධාර යටතේ ලැබුනු ඇකේෂියා ශාකය රෝපණය කලා. එමගින් කැලෑ එළිපෙහෙලි වුනා. සතුන්ට ආහාර නැතිවුනා. ශාකයේ මල් පැණි ආහාරයට ගත් මී මැස්සන් ආහාර ජීර්ණ පද්ධතිය සිරවීමෙන් මරණයට පත්වුනා. එමගින් ජනතාවගේ කෘෂි බෝගවල අස්වනු අඩු වුනා. අපි වන වගා කටයුතු සිදුකරන විට සතුන්ට ආහාරයට ගැනීමට හැකි ආහාර පැලවර්ග සිටුවීම වැදගත්. ගිණි අවි බලපත්‍ර ලබා දීමේ ඉඩම් සීමාව අක්කරයකට හෝ 1 ½ කට අඩු කරදෙන ලෙස, මේ යෝජනාවට ඇතුලත් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ් මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පසුගිය කාලේ අපි යෝජනා කලා රජයේ ඉඩමක ගස් කපනවා නම් ඒ වෙනුවට තව ගසක් සිටුවන්න කියලා. විශේෂයෙන් කොස්කැලේ ගත්තම එහි සතුන්ට ආහාර තිබුනා. ගොවි සංවිධානයකටවත් ගිනි අවියක් ලබා දෙන ලෙසට එදා අපි යෝජනා කලා. විශේෂයෙන්ම මම මේ සභාවේ යෝජනා කරනවා ගිනි අවි බලපත්‍රයක් ලබාගන්න හැකියාවක් තිබෙන ගමේ යම්කිසි ඉඩම් ප්‍රමාණයක් තිබෙන කෘෂිකාර්මික අතින් පීඩා විඳින ජනතාවට අවස්ථාව ලබා දෙන්න කියලා. ඒ සඳහා ජංගම සේවයක් තියලා හරි අදාල ආයතන එකතු කරගෙන ගිනි අවියක් ගන්න බලාපොරොත්තුවෙන් සිටින අයට එම අවශ්‍ය වන ලියකියවිලි එක දවසින් හදලා දෙන වැඩ පිළිවෙලක් හැදුවා නම් මේ ප්‍රශ්නයට යම් කිසි විසඳුමක් එයි. විශේෂයෙන් ඉල්ලීමක් කරනවා, මේ බලප්‍රදේශයේ ගස් සිටුවන විට බලප්‍රදේශයේ මහජන නියෝජිතයන් ලෙස අපෙන් අදහස් අරගෙන ඒ අනුව කටයුතු කරන ලෙසට වන සම්පත් හා වන ජීවී අමාත්‍යාංශයට මේ ගරු සභාවේ යෝජනාවක් ලෙස යවන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,යාංගල්මෝදර, මොරවලපිටිය, වදාව, නුංගමුව ඉහළ කන්ද, පහළකන්ද කියන්නේ කෘෂිකාර්මික ප්‍රදේශයක්. ඌරා, මොනරා, රිලවා, ඉත්තෑවා, දඬුලේනා වැනි සතුන් මධ්‍යම අධිවේගී මාර්ගය ඉදි වීමත් සමඟ ගම් වැදුනා. ඒ වගේම කැලේ ගස් ටික දරට කපනවා. ඒනිසාත් සතුන් ගම් වැදීමට පටන් අරන් තිබෙනවා. දැන් ගෙවල්වල තිබෙන බත් මුට්ටිය පවා ඔවුන් අරන් යන තත්වයට පත් වෙලා තිබෙන්නේ. මේ ගැටළුව සම්බන්ධයෙන්

පාර්ලිමේන්තුවෙත් කතා කලා. සමහර පළාත්වල කූඩුවලට දාලා සතුන් අල්ලන ක්‍රමයක් තිබෙනවා. අතීතයේ ගිනි අවි තිබුනා. ගිනි අවියට මේ සත්තු බයයි.අහිංසක මිනිසුන්ගේ ගිනි අවි ටික රජය විසින් ආපසු ලබා ගත්තා. ගිනි අවියක් දුන්නොත් හොඳයි. නමුත් වර්තමානයේ රට තිබෙන තත්වයත් එක්ක මිනිසුන්ට ගිනි අවි ලබා දීම පිළිබඳව ගැටළුවක් තිබෙනවා. මේ යෝජනාව අපි අගය කල යුතුයි. ගරු ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත් එමෙන්ම කෘෂිකර්ම අමාත්‍යාංශයට හා වනජීවී දෙපාර්තමේන්තුවටත් මේ පිළිබඳ දැනුම් දෙන ලෙස ගරු සභාපතිතුමියගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙය කාලෝචිත යෝජනාවක්. මේ කාලයේ නිවෙස්වල කුමන හෝ බෝගයක් වගා කරලා තිබෙනවා. නමුත් ඒ වගාවන්ට මේ සතුන්ගෙන් හානි වෙනවා. අපේ ප්‍රදේශයේ මේ ගැටළුව තිබෙනවා. භූමි භාගය, වත්කම හා වගා කරන්න පුරුද්දක් තිබෙන බලපත්‍රලාභී ගිනි අවි තිබූ අයගේ ගිනි අවි පසුගිය කාලයේ රජයට අරන් තිබෙනවා. මේ අය නැවත ඉල්ලීම් කල විට, කිසිම හේතුවක් මත නැවත ගිනි අවි ලබා නොදෙන බව හා විකල්ප ක්‍රම භාවිත කරන ලෙස ඔවුන්ට දැනුම් දී තිබෙනවා. බිම් වගාවන් ආරක්ෂා කරන්න රජය මගින් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වෙනවා. "විදුලි භූතයා" මගින් ඉත්තෑවන්, වල් ඌරන් වැනි සතුන් පාලනය කරන්න පුළුවන්. ඊට අමතරව අඟල් දෙකේ කොටු දැල වැනි උපකරණ 50% ක දායකත්වය යටතේ ගොවීන්ට ලබා දෙනවා. වර්තමානයේ පවතින තත්වයත් සමග ගිනි අවි ලබා දීම නතරකර තිබෙනවා. අපි මේ ගිනි අවි පිළිබඳ ඉල්ලීම් කලාට වැඩක් වෙන එකක් නෑ. නමුත් අපි යෝජනාවක් ලෙස එය ඉදිරිපත් කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම කාලීන යෝජනාව පිළිබඳව ඉතා වැදගත් අදහස් ප්‍රකාශ කිරීමෙන් සහය ලබා දුන් සියළු ගරු මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියන්ලාට මාගේ ස්තුතිය පුද කරනවා. මෙම වන සතුන්ගෙන් සිදුවන හානිය අවම කරගැනීමට හැකි අතුරු යෝජනා කීපයකුත් සමහර මන්ත්‍රීතුමන්ලා විසින් ඉදිරිපත් කලා. එය ඉතා වැදගත් කොට සලකනවා.

එසේම ගරු සභාපතිතුමියනි, වත්මන් කැබිනට් මණ්ඩලයේ සාමාජිකත්වය දරණ ගරු අමාත්‍යවරු කීප දෙනෙකුම මෙම වන සතුන්ගෙන් වන වගා හානිය පිළිබඳ අවධානය යොමු කර ඇති අවස්ථා පිළිබඳ මාධ්‍ය තුලින් දැනගැනීමට ලැබුනා. ඒ වුනත් තාම ඒ පිළිබඳ සාධනීය පියවරක් ගෙන නොමැති බව ඉතාම පැහැදිලියි. අපේ නව ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වයෙන් ඉදිරි සති කීපයේ දී පත්වීමට ඇති නව කැබිනට මණ්ඩලයේ කෘෂිකර්ම අමාත්‍යතුමාගේ සහ වනජීවී අමාත්‍යතුමන්ලාගේ දැඩි අවධානය යොමු වේවායි ප්‍රාර්ථනා කරනවා.එසේම අද දින සම්මත වන මෙම යෝජනාව තුලින් එතුමන්ලාගේ එම අවධානය යථාර්තයක් බවට පත්වේවායි ද ප්‍රාර්ථනා කරනවා.ඒ නිසා මෙම කාලීන යෝජනාව අපේ ගරු මන්ත්‍රිතුමන්ලා/තුමියන්ලා මෙහි දී ප්‍රකාශ කරන ලද ඉතා වැදගත් අදහස්ද සමග විෂයභාර ගරු අමාත්‍යතුමන්ලා දෙපලටත්, නව ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහ නව අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත්, වත්මන් පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ නායකතුමන්ලාටත් යොමුකරවන මෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

එසේම ගරු සභාපතිතුමියනි, විශාල අත්දැකීම් සම්භාරයක් ඇති කෘතහස්ත දේශපාලන නායකයින් දෙපලක් වන වත්මන් ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත් එතුමන්ලාගේ වගකීම් නිසියාකාරව ඉටුකර අද අපේ රට පත්ව ඇති අවාසනාවන්ත භාවයෙන් මුදවාගෙන ඉතා යහපත් රටක් ගොඩනගන්නට හැකි වේවායි ප්‍රාර්ථනා කරනවා.

ඒ අනුව ගොවි ජනතාව විසින් වගා කරනු ලබන විවිධ බව බෝගයන්ට සතුන්ගෙන් වන හානිය අවම කරවීම සඳහා විධිමත් වූ පොදු වැඩ පිළිවෙලක් දීප ව්‍යාප්තව නොපමාව දියත් කරවීමට මධ්‍යම රජයේ කෘෂිකර්ම අමාත්‍යතුමා, වනජීවී අමාත්‍යතුමන් හා ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු දේශපාලන පක්ෂ නායකතුමන්ලාගේ අවධානයට යොමු කරවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-05)ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා විසින් කරනු ලබන අංක 06/53 - 05 දරණ යෝජනාව**

අප රට පත්වෙමින් යනු ලබන උග්‍ර ආර්ථික හා දේශපාලනික අවාසනාවන්ත තත්වයෙන් අප රට හා අනාගත පරපුර එයින් මුදවා ගැනීම සඳහා ඉදිරි මැතිවරණයකට ප්‍රථම පොදු ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිත කරවීමට අවශ්‍ය පියවර නොපමාව ගත යුතු බවට, සියළු දේශපාලන පක්ෂ නායකයින්ගෙන් හා එම පක්ෂවල ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිය යුතු බවට යෝජනා කරමි.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අප රට පත්වෙමින් යනු ලබන උග්‍ර ආර්ථික හා දේශපාලනික අවාසනාවන්ත තත්වයෙන් අප රට හා අනාගත පරපුර එයින් මුදවා ඉදිරි මැතිවරණයකට ප්‍රථම පොදු ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිතකරවීමට අවශ්‍ය පියවර නොපමාව ගත යුතු බවට සියළු දේශපාලන පක්ෂ නායකයින්ගෙන් හා එම පක්ෂවල ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිය යුතු බවට යෝජනා කරමු.

ගරු සභාපතිතුමියනි, මෙම යෝජනාව අදාල න්‍යාය පත්‍රයට යොමු කිරීමට කටයුතු කිරීම පිළිබඳ ඔබතුමියට මාගේ ස්තුතිය පළමුව පුදකර සිටිනවා. ගරු සභාපතිතුමියනි, මේ වන විට අප රට පත්ව ඇති දැඩි ආර්ථික අර්බුධයෙන් හා දේශපාලන අර්බුධයෙන් ජනතාව පත්ව ඇති දැඩි අපහසුතාවය පිළිබඳ අප සියළු දෙනාම ඉතා හොඳින් දන්නවා.නිදහසින් පසු අපේ රටේ ජනතාව මෙවැනි පීඩාකාරී තත්වයකට කිසිම අවස්ථාවක පත්වී නැහැ.මේ වන විට අප රටේ ජනතාව සෑම අතින්ම අන්ත අසරණභාවයට පත්වෙලයි තිබෙන්නෙ.ලෝකයේ අනිත් රටවල් දෙස බලන විට අපේ රටට මෙහෙම වුනේ ඇයි? කියන ප්‍රශ්නය අපි හැමකෙනෙකුටම තිබෙනවා.

නිදහසින් පසුව පක්ෂ දේශපාලනය තුළ ප්‍රධාන පක්ෂ දෙක වන එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මාරුවෙන් මාරුවට මේ රට පාලනය කර තිබෙනවා. අපේ රටට මෙහෙම වෙන්න හේතු පිළිබඳ එකිනෙකාට ඕනතරම් හේතු එල්ල කරගන්න පුළුවන්. විවාදකරන්න ඕන තරම් පුළුවන්. නමුත් එයින් කිසිම සෙතක් නම් වෙන්නේ නැහැ.

මත ගැටුම් ඇතිකරගන්නවත්, අනවශ්‍ය විවාදයක් ඇතිකරගන්නවත් නොවෙයි මා මෙම යෝජනාව ඉදිරිපත් කලේ.ඒ ගැන ඔබ සියළු දෙනාගේම අවධානය යොමු කරවන මෙන් මා ඔබතුමන්ලා සැමගෙන්ම පළමුව ඉල්ලා සිටිනවා. ඒ නිසා පුංචි මහජන ආයතනය වන ප්‍රාදේශීය සභාව නියෝජනය කරන මහජනතාවගේ නියෝජිතයින් වන අපි අපේ ජනතාව අදවනවිට පත්ව ඇති අසහනකාරී, පීඩාකාරී තත්වයෙන් ඔවුන් මුදවා ගැනීමට යම් දායකත්වයක්, යම් මැදිහත්වීමක් දක්වන්නට හැකිනම් නිරතුරුවම අප එය ඉටුකලයුතු වෙනවා.

අද අපට අපේ ජනතාවට, අපේ රටට මෙහෙම වෙන්න බලපෑ හේතු ගණනාවක් තිබෙන බව අපි හැම කෙනෙක්ම දන්නවා. අද 80% ක් ම මහජනතාව කියන්නේ හොරකම හා දූෂිත දේශපාලනය නිසා අපේ රටට ජනතාවට මේ දුක්ඛිතභාවයට පත්වන්නට හේතු වුණ බවයි. එහි සත්‍යතාවයක් අනිවාර්යෙන්ම තියනවා. නමුත් ඒ විතරක්ම නොවේ. වැරදි කළමනාකරණය හා අත්දැකීමෙන් තොර නායකත්වයට අසීමිත බලයක් ලබා දීමත් හේතු වශයෙන් දක්වන්න පුළුවන්.

ඒ සියල්ලටම වඩා මම දකින්නේ අපේ රටේ ජාතික ප්‍රතිපත්තියක් නැති පාලන තන්ත්‍රයක් පැවත ඒමයි. අපේ රට මෙන් නිදහස ලබාගත් බොහෝ රටවල් නිදහසින් පසු පූර්ණ සංවර්ධිත රටවල් ලෙස අද ලෝකයේ ප්‍රබලත්වයට පත් වී තිබෙනවා. උදාහරණ ලෙස අසල්වැසි ඉන්දියාව පෙන්වා දෙන්න පුළුවන්. එසේ වුවත්, අපේ රට නිදහස ලබාගත් දා සිට සංවර්ධන වෙමින් තිබෙන හා අන් රටවල්වලින් යැපෙන දිළිඳු රටක් ලෙස ඉතිහාස ගත වෙලා තිබෙනවා. නිදහසින් පසු එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මගින් මාරුවෙන් මාරුවට අපේ රට ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ පාලනය වී තිබෙනවා. ග්‍රාමීය ජනතාවට නායකත්වය ලබාදෙමින්

ඔවුන් පෙළගස්වා පාලන බලය ලබා දෙන්නට බිම් මට්ටමේ නියෝජිතයින් ලෙස අපිද ඒ වෙනුවෙන් කැප වෙලා තියනවා. අන්න ඒ නිසා අපිටද යම් යුතුකමක් යම් වගකීමක් තිබෙනවා මේ තත්වයෙන් අපේ රට, අපේ ජනතාව මුදා ගන්නට යමක් කරන්නට, යමක් ලියන්නට, යමක් කියන්නට. අප රටේ පාලන බලය ලබාගත් දේශපාලන පක්ෂ විසින් යම් ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිත කර තිබුණේ නම් අද අපේ රටට මෙහෙම විපතක් වෙන්නේ නැහැ.

අන්න ඒ නිසා බිම් මට්ටමේ පුංචිම මහජන ආයතනයේ මහජන නියෝජිතයින් වන අපි දැන්වත් අපේ දේශපාලන නායකයින්ට බල කර කියා සිටිය යුතු වෙනවා ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපනය කිරීමට නොපමාව කටයුතු කළ යුතු බවට.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එය හොඳ යෝජනාවක්. රටේ ජාතික ප්‍රතිපත්තියක් ඇතිවිය යුතුයි කියන යෝජනාවක්. මේ යෝජනාව රටේ ජනාධිපතිතුමාට, අගමැතිතුමාට වගේම නිර්පාක්ෂික අරගලයේ ප්‍රධානියෙකුටත් යවන්න ඕනෑ. ජාතික ප්‍රතිපත්තිය වැදගත්. ඒ ප්‍රතිපත්තිය කොහොමද වෙන්නේ කියන ගැටළුව තිබෙනවා. අනාගතයට ජාතික ප්‍රතිපත්තියක් යා යුතුයි කියන එකයි බොහෝ දෙනෙකුගේ මතය. ජාතික ප්‍රතිපත්තියක් තිබෙන රටවල් පසුගිය කාලයේ දියුණු කරගෙන රටේ යම් ස්ථාවරත්වයක් හදලා රටේ යම් කිසි විනයක් ඇතිව රට පාලනය කරන්න පුළුවන් දක්ෂ නායකයෝ ලෝකේ පහලවෙලා තිබෙනවා. අපේ මේ සුන්දර රටේ මිනිසුන්ගේ විනය පිරිහිලා තිබෙනවා. විනයක් නැති තැන පාලනයත් නැතිවෙලා තිබෙනවා. විනයත් එක්ක පාලනයත් තිබෙනවා නම් කිසිම ප්‍රතිපත්තියක් අවශ්‍ය වෙන්නේ නෑ. මේ යෝජනාව ක්‍රියාත්මක වෙනවා නම් අලව්ව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු සියළු දෙනාගෙම කැමැත්ත හිමි වෙනවා. ඒ නිසා මේ කටයුත්තට අපේ පූර්ණ සහයෝගය ලබා දෙනවා. අපේ නායකයින්ට ඇස් ඇරිලා මේ කටයුත්ත ශක්තිමත් කරලා පුංචි ප්‍රාදේශීය සභාවෙන් එන යෝජනාත් සමස්ත ප්‍රාදේශීය සභාවලත් යෝජනා එක්ක මේක ක්‍රියාත්මක කලොත් මෙය වැදගත්ම ජාතික ප්‍රතිපත්තිය කියලා රටට හඳුන්වලා දෙන්න පුළුවන් කියන එක මම ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි රටක් විදියට ඉස්සරහට යනකොට අපිට කොතනද වැරදුනේ කියන එක සොයා බැලිය යුතුයි. අපිට ජාතික ප්‍රතිපත්තියක් වගේම ප්‍රාදේශීය ප්‍රතිපත්තියක්, පළාත් ප්‍රතිපත්තියක් තිබිය යුතුයි. අපේ මන්ත්‍රීවරු හොඳ යෝජනා ගෙනාවොත් අපි අත් දෙකම උස්සලා සහයෝගය ලබා දෙන්න ඕනෑ. ඒ අපිට ප්‍රතිපත්තියක් තිබෙන නිසා. සභාවක් ලෙස අපි හැමෝටම හැකි නම් ගේන හොඳ යෝජනා වලට සහය දෙන්න, ඒක තමයි ප්‍රාදේශීය ප්‍රතිපත්තිය. විශේෂයෙන් ජයතිලක මන්ත්‍රීතුමා මේ ගෙන ආ යෝජනාව පාර්ලිමේන්තුවට යවලා පාර්ලිමේන්තුවේ සිටින බුද්ධිමත් මහජන නියෝජිතයන් තීන්දු ගෙන, රටට යහපත් තීන්දුවක් ගන්න පුළුවන් නම් මම විශ්වාස කරනවා ඒ තමයි අපේ මහජන නියෝජිතයන්ගේ කාර්යභාරය හා යුගයේ අවශ්‍යතාවය කියලා.

**ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,අපේ රටේ ජාතික ප්‍රතිපත්තියක් සකස් විය යුතුයි කියන කාරණාව ප්‍රාදේශීය වශයෙන් නොවෙයි ජාතික වශයෙන් අද රටේම මතුවෙලා තිබෙන ප්‍රශ්නයක්. මේක අද ඊයේ නොවෙයි අවුරුදු 15 ක විතර ඉඳලා තිබෙන ප්‍රශ්නයක්. අපිට ජාතික ප්‍රතිපත්තියක් නෑ. ඒ නිසා අපේ රට තිරසාරව ගලාගෙන යන්නේ නෑ. දේශපාලන පක්ෂයක් එනවා, ඒ පක්ෂයට අවශ්‍ය විදියට තමයි ප්‍රතිපත්ති හදන්නේ. ඒක ක්‍රියාත්මක වන කාලය එන විට නැවත මැතිවරණයක් ඇවිල්ලා ඒ දේශපාලන පක්ෂය වෙනස් වෙනවා. ඒ වගේම පසුගිය පාර්ලිමේන්තු මැතිවරණය වෙලාවේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ එක්සත් ජාතික පක්ෂයේ එම යෝජනාව තිබුනා. ඒ සර්ව පාක්ෂික ආණ්ඩුව කියන ව්‍යවහාරය නොවෙයි, අපි පාර්ලිමේන්තුවට එන සියළුම මන්ත්‍රීවරුන්ගෙන් යුත් ඒකාබද්ධ ආණ්ඩුවක් හදනවා කියන එකයි රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ

ගිය වර මහා මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබුනේ. නමුත් 3 න් 2 ක ජනවරමක් අරන් ආපු ආණ්ඩුවට, ප්‍රාදේශීය සභාවට පැහැදිලි ජනවරමක් අරන් ආපු පොදුජන පෙරමුණට ඒ ක්‍රියාවලිය ඇතුලේ සිදු වුන යම් යම් අඩුපාඩුත් එක්ක මහත් කඩා වැටීමක් සිද්ධ වුනා. ආර්ථික අර්බුධයක් තමයි රටේ පළමුවෙන්ම නිර්මාණය වුනේ. ආර්ථික අර්බුදයක් ඇතිවුන බොහෝ රටවල දෙවන වරට දේශපාලනික අර්බුදයක් ඇති වෙනවා. ඊලඟට සර්වාපාක්ෂික ආණ්ඩුවක් ඇති කල යුතුයි කියන මතය මුලින්ම ඉදිරිපත් කලේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. මේ කාරණා පිළිබද කතා කරන විට අපට ගාලුමුවදොර අරගලය අමතක කරන්නත් බැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිසංස්කරණ ගැන ඒ ගොල්ලෝ කියනවා. සෑම අවස්ථාවකදීම මේ ජාතික ප්‍රතිපත්තිය හදන්න යන විට මේ රටේ පාඩු ලබන රාජ්‍ය ආයතන ගණනාවක් තිබෙන බව අප මතක තබාගත යුතුයි. එයට හේතුව එක එක ඇමතිවරු එන විට හිතවතුන් මේ ආයතන වලට දාගන්නවා. ඔවුන්ට වැටුප් ගෙවීමට සිදු වෙනවා. ඒ නිසා එම ආයතනවලට නියමිත සේවක ප්‍රමාණයක් සිටින ලෙස ප්‍රතිපත්ති සැදිය යුතුයි. ඒ වගේම මේ ආයතන පාඩු ලබන හේතුව සොයා බලන්න. මේවාට වෙනස් නොවන ප්‍රතිපත්ති හදන්න ඕන. පාඩු ලබන ආයතන ඒවාට හේතු මොනවාද යන්න පාර්ලිමේන්තුවට උත්තර බැදීමට අවස්ථාව ලබා දිය යුතුයි. රටේ ආර්ථිකය ගොඩ නැගීමට අපේ අවශ්‍යතාවයට යම් ප්‍රමාණයක් හෝ නිෂ්පාදනය අපිම කරගත යුතුයි. අපේ රටේ  අධ්‍යාපනය වෙනුවෙන් ජාතික ප්‍රතිපත්තියක් සැදිය යුතුයි. රටේ නීතිය ස්වාධිපත්‍ය ස්ථාපිත විය යුතුයි. ජාතික ප්‍රතිපත්තියක් හදන්න වගේම ගරු සභාපතිතුමියගෙන් මම ඉල්ලා සිටිනවා අපිටත් එදාට යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාවක්  ලබා දෙන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඇත්තටම මේ රටට අළුත් වැඩපිළිවෙලක්, ප්‍රතිපත්තියක් ස්ථාපනය විය යුතුයි කියලා මත වාදයක් ඉදිරිපත් වුනේ අද නොවෙයි. මේ රටේ මහජන මුදල් කෝටි ප්‍රකෝටි ගණන් නැති වුන එක ගැන කතා කරන්නේ නැහැ. මේකේ අවසාන ප්‍රතිඵලය හැටියට අද මේ රට බංකොලොත් වෙන තැනට ඇවිල්ලා තියනවා. ඒ පීඩනය තමයි අරගලය විදිහට ආවේ. මේ රටේ දේශපාලනඥයින්ට ඕනෑම වරදක් කරලා ගැලවිලා යන්න තිබෙන අවස්ථාව නැති කල යුතුයි. අපි මේ පාර්ලිමේන්තුවෙන්ම මේ ප්‍රතිපත්ති ටික හදලා මැතිවරණයකින් ජනතා නියෝජිතයෝ තෝරගන්න තැනට යන්න ඕන. ඒකයි විය යුත්තේ. මේ රටට හොරකම් කරන්න බැරි නීති පද්ධතියක් හදලා අළුත් ව්‍යවස්ථාවක් හදලා මේ රටේ ජනවරමකටම යන්න ඕන. අන්න එවිටයි මේ රට සාර්ථක වෙන්නේ. මේ රටට ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍යයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ රටට ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍යයි. මේ ගෙනා යෝජනාවට අපි පක්ෂයි. මේක අපිට විරුද්ධ වෙන්න ඕන කාරණාවක් නොවෙයි. මේ රටට අදාල ජාතික ප්‍රතිපත්ති සැකසීමේ මේ කමිටු වලට අපි ජනතා විමුක්ති පෙරමුණ හැටියට සම්බන්ධ වෙන්නේ නෑ කියලා මතයක් මේ ගරු සභාව තුල මන්ත්‍රීවරු හැදුවට අද දවසෙත් අපේ පක්ෂ නායක අනුර කුමාර සහෝදරයා ගරු ජනාධිපතිතුමා මුන ගැහෙනවා. ඒ මුන ගැහෙන්නේ ජනතා විමුක්ති පෙරමුණට මේ රට සම්බන්ධයෙන් තියන වැඩ පිළිවෙල හා ප්‍රතිපත්ති මේ රටේ ජනාධිපතිවරයාට ඉදිරිපත් කරලා මෙන්න මේකයි අපේ දැක්ම , මෙන්න මේකයි අපේ ප්‍රතිපත්තිය. එයට අනුව වැඩ කිරීමට කැමති නම් අපි කැමතියි ආණ්ඩුවේ වගකීම් ගන්න යන ප්‍රකාශය තමයි අපි කරන්නේ. අද මේ තිබෙන පෝලිම් ක්‍රමය ජනතා විමුක්ති පෙරමුණේ හදපු ඒවා නෙවෙයි. අරගලේ අපිට තිබුනේ අරමුණු දෙකයි. එකක් ජනතාවගේ හිත ඇතුලේ කැකෑරෙන කෝපය. තමන්ගේ තිබුණ වේදනාව මේ ආණ්ඩුවට බලපෑමක් විදිහට කරලා මාස 06කින් පාර්ලිමේන්තුව විසිරුවලා මැතිවරණයකට යාමයි අපේ අරමුණ බවට පත්වුනේ. අරගලයේ තව එක් කාරණයක් තියනවා.  අපි නොවෙයි, ලාල්කාන්ත සහෝදරයායි මේ කාරනේ කීවේ. අපි කීවේ නැහැ අරලියගහ මන්දිරයට ගිනි තියන්න කියලා. අපි කීවේ නැහැ ජනාධිපති මන්දිරයට ගිනි තියන්න කියලා. අපි ප්‍රකාශ කරපු කාරණයක් තිබ්බා. 225 පාර්ලිමේන්තුව ගිය මොහොතක පාර්ලිමේන්තුව වට කරලා අපි අභියෝග කරමු. නුඹලා මේකෙන් එලියට එන්න එපා. ඕක විසිරුවලා වරෙල්ලා. ඒක පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථානුකූලයි. අද මේ සියලු දේ අපට ලඝු කරන්න හැදුවට මේ දෙගොල්ලෝ රැකෙන ආණ්ඩුවක් හදන්නයි මේ යන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, දැන් මේ රට වැටිලා තිබෙන වෙලාවක්. මේ රටේ ආර්ථිකය කඩා වැටීමට හේතුව තමයි, එල්.ටී.ටී.ඊ. යුද්ධ කාලයේ ජීවිත ගණනාවක් අහිමිවුනා. සංචාරකයෝ ආවෙත් නැහැ. ඉතින් ඒකත් ලොකු හානියක් වුනා. මේ රට පාලනය කල පක්ෂ විපක්ෂ වල දේශපාලඥයින්ගෙන් යම් පිරිසක් හොරකම් කලා. එයත් මේ රටේ ආර්ථිකය කඩා වැටීමට හේතුවක් වුනා. ඊලගට ජේ.වී.පී. කැරලි ටික මේ රටේ ආර්ථික කඩා වැටීමට හේතුවක් වුනා. එමගිනුත් මේ රටේ ආර්ථිකයට විශාල හානියක් වුනා. රටේ හිටපු පාලකයෝ අපේ රටේ දේශීය ආර්ථිකය ශක්තිමත් කලේ නැහැ. විදේශ විනිමය ගෙනෙන වැඩපිළිවෙලක් සකස් කෙරුනේ නැහැ. අපේ රටේ පාලකයෝ නිලධාරීන් වගේම මහජනතාවත් වග කියන්න ඕන මේ ආර්ථික අර්බුදයට ජාතික ප්‍රතිපත්තියක් තුලින් රට හදන්න උදව් කරන්න ඕනැ. දරුවන්ගේ අධ්‍යාපනය අද කඩා වැටිලා තියනවා. මේක දේශපාලනය කරන වෙලාවක් නෙවෙයි. මේකට අපි හැමෝම එකතු වෙලා හයියක් වෙන්න ඕනෑ. හැමෝම එක අම්මගේ දරුවෝ වගේ රට හදන්න ඕනෑ. රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ වෙලාවේ ගත්ත තීන්දුව හොඳයි. ඒ වගේම මහ බැංකු අධිපතිතුමා නියම නායකයෙක්. ඒ නිසා මේ රට හදන ප්‍රතිපත්තියට අපි හැමෝම සහය ලබා දෙමු කියලා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, කොරෝනා වසංගත කාලයේ හිටපු ජනාධිපතිතුමා ඒ සදහා අවශ්‍ය තරම් එන්නත් ගෙනවා. ඒ වාගෙම වියලි ආහාර ද්‍රව්‍යාධාර ලබා දුන්නා. ඒ වගේම රු. 5000.00 බැගින් ආධාර ලබා දුන්නා. නමුත් කාබනික පොහොර වගාව නිසා එතුමාට වැරදීමක් වුණා. ඒ නිසා ආර්ථික අර්බුදයට මුහුණ දීමට සිදු වුනා. අද රනිල් වික්‍රමසිංහ මහතා රට භාර ගත්තා. ඔබතුමාගේ යෝජනාවට ගරු කරන අතරම පොදු ප්‍රතිපත්තයට අපේ සහයෝගය ලබා දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ජයතිලක මන්ත්‍රීතුමා ගෙන ආපු යෝජනාව ඉතා වටිනා යෝජනාවක්. මේ කාලයට ඕනෑ පක්ෂ පාට බෙදිලා කටයුතු කිරීම නොවෙයි. ජනතාවට සේවය කිරීමයි. එසේ කිරීමට අපි සියළු දෙනා එකතු වෙලා තීන්දු තීරණ ගත යුතුයි. මෙතුමා ගෙනා මේ ජාතික ප්‍රතිපත්තිය රටේ ස්ථාපිත වෙනවා නම් හොඳයි.මේ පෝලිම් ක්‍රමය නිර්මාණය වුණේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ කාලේ කියනවා නම් එය වැරදියි. අපි සියළු දේ ආනයනය කරන්න තමයි උත්සහ කරන්නේ. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ එතුමිය මේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට කර්මාන්ත ශාලා ආරම්භ කලා. නමුත් මේ රටට විවෘත ආර්ථිකය ආවට පස්සේ ජනතාව එයින් උපරිම ප්‍රයෝජන ගැනීමට උත්සාහ කලා. එදා අපේ රටේ සිරිමාවෝ බණ්ඩාරණායක මැතිනියගේ සංකල්පය ආවා නම් අද අපේ රටත් සිංගප්පූරුවක් බවට පත්වෙලා. නමුත් එදා ඒකට කවුරුවත් කැමති වුනේ නෑ. කාලෙන් කාලට ආපු දේශපාලන පක්ෂ ඒ ක්‍රමය වෙනස් කලා. මේ රටට එක ප්‍රතිපත්තියක් සෑදිය යුතුයි. කවුරු බලයට ආවත් ඒ ප්‍රතිපත්තියේම සිටිය යුතුයි. ඒ නිසා අපි මේ අලව්ව ප්‍රාදේශීය සභාවේ යෝජනා කරනවා මේක ආදර්ශයක් කරගෙන සියළු නායකයින්ට සම්මුතිවාදයෙන් එකමුතුව වැඩ කරන්න අපි යෝජනාවක් හදමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඉතාම වටින කාලෝචිත යෝජනාවක්. මේ රට ආර්ථික අර්බුදයකට වැටිලා තිබෙන වෙලාවේ සියළු පක්ෂ බේද අමතකකරලා පොදු වැඩපිළිවෙලකට මේ රට ගොඩනැගිය යුතු කාලයක් ඇවිල්ල තිබෙන්නේ. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගෙන් පස්සේ තිබුන සෑම රජයක්ම මේ සදහා වගකිව යුතුයි. වසර ගණනාවක් පැවති මේ අර්බුදය ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ කොරෝනා වසංගතයත් සමඟ වැඩිවෙන්න පටන් ගත්තා. කෝරෝනා වසංගතයෙන් මිනිසුන් බේරා ගැනීමට ක්‍රියාකල නිසයි අද එතුමා මේ තත්වයට පත්වුනේ. අද රටේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීගේ සිට ජනාධිපතිතුමා දක්වාත් නිලධාරීන් විදියට ග්‍රාම නිලධාරීගේ

සිට ජනාධිපති ලේකම් දක්වාත් සියළුම රාජ්‍ය නොවන සංවිධාන සහ ස්වේච්ඡා සංවිධාන වල මෙන්ම දේශපාලන පක්ෂ වල වත්කම් විගණනය කරන්න පුළුවන් පනතක් ගෙනැල්ලා ඒ විගනන පණතෙන් කොමිෂන් බලය දෙන්න කියලා මේ අරගලකරුවෝ කවුරුත් ප්‍රකාශ කලේ නෑ. මොකද එහෙම ප්‍රකාශ කලා නම් වැඩියෙන්ම මුදල් තියෙන ඒ දේශපාලන පක්ෂ වලට ඔප්පු කරන්න විදියක් නැතුව යනවා ඔවුන් තමා මේ රටේ දේපල වැඩියෙන්ම හොරා කෑවේ, ඔවුන් තමා ජාතික සම්පත් විනාශ කලේ. ඔවුන් එසේ කලේ ප්‍රජාතන්ත්‍රවාදය තුලින් බලයට එන්න බැරි නිසා වෙනත් ආකාරයකට ඔවුන් බලය ලබාගෙන ඔවුන්ගේ මඩිය තදකරගන්න. ඔවුන්ට කිසිම අවශ්‍යතාවයක් නෑ මේ රට සංවර්ධනය කරන්න. ඒ නිසා මේ ගරු මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව ඉතාමත් කාලෝචිත යෝජනාවක්. ඒවෙනුවෙන් මගේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපේ පක්ෂ නායකතුමාගේ නම කීප සැරයක්ම කියවුනා. මගේ වගකීම අපේ නායකතුමා සම්බන්ධව වචන කීපයක් කතා කිරීම. රනිල් වික්‍රමසිංහ මැතිතුමාට බැඳුම්කර චෝදනාව අපු අවස්ථාවේ එතුමා මුනගැහිලා අපි ඇහුවා මේ ගැන ඔබතුමා මොනවද කියන්නේ කියලා. වෙනදා ප්‍රශ්නයක් ඇහුවම උත්තර දෙන පුද්ගලයා කියනවා මේකට උත්තර දෙන්න අවශ්‍ය නෑ. අධිකරණයේ නඩුවක් ගිහිල්ලා ඒ නඩුවට අධිකරණයේ තීන්දුව ආවම මම අධිකරණයේ වැරදිකරු උනොත් එදාට ඒක පිළිගන්නවා කියලා. ඒ වගේම චන්ද්‍රිකා බණ්ඩාරණායක මැතිනියගේ ආණ්ඩුව කාලේ හිටපු ඇමතිවරුන්ගේ උවමනාවට රනිල් වික්‍රමසිංහ මැතිතුමාට විරුද්ධව පරිගණක සම්බන්ධ නඩුවක් දානවා. නමුත් පරිගණක ලංකාවට හඳුන්වලා දුන්නෙත් රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ කාලයේ. ඒ නිසා එතුමා අධිකරණයට ගිහින් ඒ සම්බන්ධව කරුණු පැහැදිලි කරලා නඩුවෙන් නිදහස් වෙනවා. ඒ වගේම චන්ද්‍රිකා බණ්ඩාරණායක මැතිනිය තව දවසක කියනවා රනිල් වික්‍රමසිංහ මැතිතුමා මගේ ආණ්ඩුවේ අගමැති හැටියට ඉදලා ගෙනා වැඩපිළිවෙල එතුමට ක්‍රියාත්මක කරන්න දුන්නා නම් ජපන් ආධාර එක්ක යලි පුබුදමු ශ්‍රී ලංකා කියන වැඩසටහන අපිට පිටරටවලට උදව් කරන්න පුළුවන් විදියට ආර්ථිකය හදන්න තිබුනා කියලා. මම හැමවේලාවේම දැක්ක දෙයක් තිබුනා. අපි පක්ෂ පාට වලට බෙදෙන්නේ නැතිව එකට එක් වෙලා ගමනක් යනව නම් තමයි අපිට හොඳ රටක් නිර්මාණය කරගන්න පුළුවන් වෙන්නේ. අපි අනෙක් අයගේ දේශපාලන ප්‍රතිපත්ති වලට ගරු කරනවා නම් තමයි අපිට ගමන් යන්න හැකි වෙන්නේ. දැන් සුබවාදී තැනකට රට ඇවිල්ලා තිබෙන වේලාවේ. මෙතුමා ගෙන ආ යෝජනාව පුරාම තිබෙන්නේ රටේ මේක ක්‍රියාත්මක වෙන්නේ කොහොමද අපේ සභාව තුල මෙය ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියන එක. ඒ වගේම රටට ජනමාධ්‍ය ආයතනත් දේශපාලන පක්ෂ වලට අනවශ්‍ය විදියට බලපෑම් එල්ල කරනවා නම් ඒක හැම වෙලේම රටක විනාශයට හේතුවෙනවා. ඒ නිසා අපි හැමෝම එකතු වෙලා සුබවාදී ගමනක් යා යුතු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,මෙම කාලීන යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් එකඟතාවය පළකල ඔබ සියළු දෙනාටම මාගේ ප්‍රණාමය පුද කරනවා.

අපේ ගරු මන්ත්‍රීවරු කීපපලක්ම යෝජනාවට පක්ෂපාතීත්වය පල කරන අතර නිර්පාක්ෂික අරගලය ගැන කතා කලා. එසේම අපේ පක්ෂයේ නායක වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගැන අනවබෝධයෙන් කතා කලා. ඒ ගැන මා ඉතා කණගාටු වෙනවා. අරගලය ආරම්භ උනේ නිර්පාක්ෂිකව. පසුව ඇතැම් දේශපාලන පක්ෂ තමන්ගේ පටු දේශපාලන අරමුණු ඉටු කරගැනීමට එම නිර්පාක්ෂික අරගලයට ඇතුළු උනා. අරගලය අල කලා. අරගලය අල කිරීමේ වගකීම විපක්ෂ දේශපාලන පක්ෂ භාරගත යුතුයි. එක්සත් ජාතික පක්ෂය අරගලයට කිසිම සහයෝගයක් ලබා දුන්නේ නෑ. එසේ වුවත් දැන හෝ නොදැන අරගලය ආරම්භ වීමට අපේ පක්ෂයත් සමගි ජන බලවේගයත් රුකුල් උනා. එයින් වැඩි කොටස බැර විය යුත්තේ සමඟි

ජන බලවේගයට බව නොබියව ප්‍රකාශ කරනවා. පසුගිය මහ මැතිවරණයේදී අපේ එක්සත් ජාතික පක්ෂය දෙකට කැඩුණා. ඒ හේතුව නිසා එක්සත් ජාතික පක්ෂය බින්දුවට වැටුනා. ඉතිහාසයේ පළමු වතාවට එක් ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙකුට පමණක් සීමා උනා. සමඟි ජන බලවේගය ප්‍රධාන විපක්ෂය බවට පත් වුනා. එක්සත් ජාතික පක්ෂය දෙකට කැඩීමේ වේදනාව නිසා නිර්මල එක්සත් ජාතික පාක්ෂික ඡන්ද දායකයින් ලක්ෂ 25 කට වඩා වැඩි පිරිසක් ඡන්දය දීමෙන් වැලකුනා. මේ හේතුව නිසා පොහොට්ටුවට ලක්ෂ 69 ක ජන වරමක් ලැබී ශක්තිමත් රජයක් බිහි කරගත්තා. ඒ නිසා 19 වෙනි සංශෝධනය අහෝසි කර 20 වැනි සංශෝධනය බලගැන්වුවා. ඒ නිසා ඒකාධිපති බලයක් තුල අත්දැකීමෙන් තොර පිරිසක් රට පාලනය කලා. බලයට පත්කල අය දෙන ලද පොරොන්දු අමතක කර ඒකාධිපති බලය ඉස්මතු කරගත්තා. ඒ හේතුව නිසාම බලය ලබා දුන් අය නිර්පාක්ෂික අරගලයක් ආරම්භ කලා. පටු දේශපාලන වාසිලබා ගන්නට විපක්ෂයේ ඇතැම් පක්ෂ අරගලයට සම්බන්ධ වී අරගලය අල කලා. එදා එක්සත් ජාතික පක්ෂය දෙකට නොකැඩුනා නම් ඡන්ද පොලට නොගොස් සිටි ලක්ෂ 25 කට වැඩි නිර්මල එක්සත් ජාතික පාක්ෂිකයින් පිරිස අලියා ඉදිරියේ කතිරය ගසනවා. සමඟි ජන බලවේගයට ලැබුණු ඡන්ද සංඛ්‍යාවත් එක්සත් ජාතික පක්ෂයට වැටුණ ලක්ෂ 03 කට ආසන්න ඡන්ද සංඛ්‍යාවත් ඡන්ද පොලට නොගිය ලක්ෂ 25 කට අධික ඡන්ද සංඛ්‍යාවත් එකතු වූවා නම් පොහොට්ටුවට රජයක් පිහිටුවන්න වෙන්නේ ආසන දෙක තුනක පරතරයකින්. එසේ වූවා නම් 19 අවලංගු වන්නේත් 20 සම්මත වන්නේත් නැහැ. අරගලයක් බිහිවන්නේද නැත. මෙතරම් විශාල පොදු හෝ පුද්ගලික දේපල විනාශ වීමක් සිදුවන්නේ නැත. ඒ විනාශයට වගකිව යුත්තේ කවරෙකුදැයි ඔබ නිහඬව සිතා බලන්න.

ගරු රනිල් වික්‍රමසිංහ වත්මන් ජනාධිපති අපේ පක්ෂයේ නායකතුමා ගැන ඇතැම් මන්ත්‍රීවරයෙකු වැරදි අවබෝධයකින් කතා කලා. ඒ ගැන කණගාටු වෙනවා. ඒත් එකක් කිව යුතුයි. අරගලය නිසා පුරප්පාඩු වූ අග්‍රාමාත්‍ය ධූරය භාරගන්න කිසිවෙකු ඉදිරිපත් වූයේ නෑ. සියළු දෙනාම මග හැරියා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා එම වගකීම භාර නොගන්න රට අරාජික වෙනවා. එසේ වූවා නම් අපේ ඉරණමට කුමක් වෙයිද?

අන්න ඒකයි මම කීවේ රටේ ජනතාව එතුමාට ණයගැතියි. දැන් බිහිවී ඇත්තේ සැබෑ අරගලය. සැබෑ අරගලය ජයගැනීමට නම් පාට, පක්ෂ, කුලමල, ආගම් ටික කාලයකට අමතක කර රටට යහපත් ආර්ථික හා දේශපාලන වාතාවරණයක් උදා වනතුරු නව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඇතුළු බිහිවෙන රජයට සැමගේ සහයෝගය හා ආශිර්වාදය ලබා දිය යුතුමයි.

නිශ්චිත කාලයකින් රට යථා තත්වයට පත් වූ පසු සැමගේ එකඟතාවයෙන් පොදු ජාතික ප්‍රතිපත්තියක් තුල මැතිවරණයක් ජනතාවට ලබා දිය යුතුයි.

එබැවින් මෙම යෝජනාව, යෝජනාවේ සඳහන් පරිදි දේශපාලන පක්ෂ නායකයින්ටත් එම පක්ෂවල ලේකම්වරුන්ටත් නොපමාව යොමු කරවීමට අවශ්‍ය කටයුතු කරවන මෙන් ඔබතුමියගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

ඒ අනුව අප රට පත්වෙමින් යනු ලබන උග්‍ර ආර්ථික හා දේශපාලනික අවාසනාවන්ත තත්වයෙන් අප රට හා අනාගත පරපුර එයින් මුදවා ගැනීම සඳහා ඉදිරි මැතිවරණයකට ප්‍රථම පොදු ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිත කරවීමට අවශ්‍ය පියවර නොපමාව ගත යුතු බවට, සියළු දේශපාලන පක්ෂ නායකයින්ගෙන් හා එම පක්ෂවල ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිය යුතු බවට ගෙන ආ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(05-06)<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා විසින් කරනු ලබන අංක 06/53 - 06 දරණ යෝජනාව</u>**

අලව්ව නගරයේ ඉදිකිර ඇති ගරු එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරණායක ශ්‍රීමතානන්ගේ පිළිරුව මේ වන විට ඉතා අබලන් තත්වයට පත්ව ඇත. පසුගිය දිනවල සමාජ මාධ්‍ය ජාල ඔස්සේ ද මේ බව ප්‍රචාරය විය. රටට සුවිශාල සේවයක් ඉටු කල බණ්ඩාරණායක මැතිතුමගේ මෙම පිළිරුවට මෙසේ හානි

සිදුවීමට ඉඩහැරීම අලව් පුරවරයේ ජීවත් වන අප හට කණගාටුවට හේතුවකි. එම නිසා හැකි ඉක්මනින් මෙම පිළිරුව ප්‍රතිසංස්කරණය කර යථා තත්වයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සැලසීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි මේ පිළිරුව ලඟ නැවතිලා මෙය හරියට දැක්කේ නෑ. අපේ රටට සුවිශාල සේවයක් කල මෙතුමාගේ පිළිරුව ප්‍රතිසංස්කරණය කරනවාට මේ පක්ෂ විපක්ෂ කවුරුත් විරුද්ධත්වයක් ප්‍රකාශ කරන එකක් නෑ. මේ පිළිරුවට කිසිම හවුහරණක් නෑ. ඒ නිසා හැකි නම් මේ සඳහා පියස්සක් ඉදිකර මෙය සංරක්ෂණය කරන ලෙසත් එමෙන්ම නැවත තීන්ත ආලේප කර එයට වහලයක් ඉදි කර රාත්‍රී කාලයේ දැල්වෙන ආකාරයට විදුලි පහනක් සවි කරන ලෙසත් මම මේ මහා සභාවට යෝජනා කරනවා. මෙය අලව්වට පිවිසෙන ප්‍රධන තැන. ඒ නිසා මෙය හැකි ඉක්මනින් ප්‍රතිසංස්කරණය කරලා ආරක්ෂා කරමු කියලා මම මේ සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මම ස්ථිර කරනවා. 2001 වර්ෂයේ ඔබතුමිය සංවිධායකවරියක්ව සිටි කාලෙත් පළමුවෙන්ම මෙම පිළිරුව ප්‍රතිසංස්කරණය කලා. ඉන් පසු දෙවන වතාවටත් එය ප්‍රතිසංස්කරණය කලා. මෙම පිළිමයට හානියක් නොවන විදිහට මෙය ප්‍රතිසංස්කරණය කල යුතුයි. අලව්ව නගරය ගත්තම ප්‍රධාන සංකේත දෙකක් තිබෙනවා. එකක් අලව්ව පාලම අනෙක තමයි මේ බණ්ඩාරනායක පිළිරුව. මේ වෙනුවෙන් කල හැකි දායකත්වය අපි ඉක්මනින් කරමු. ඒ වගේම මෙම පිළිරුව ප්‍රතිසංස්කරණය කිරීමට නොහැකි වුනේ රටේ පැවති අස්ථාවරභාවය නිසා බව කිව යුතුමයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2015 යහපාලන ආණ්ඩුව කාලයේ මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා අලව්ව එන්න ප්‍රථමව 1991 ප්‍රාදේශීය සභා අපේක්ෂක අමරතුංග අතපත්තු මැතිතුමා විසින් එයාගේ පුද්ගලික වියදමින් මෙය තීන්ත ආලේප කරල ප්‍රතිසංස්කරණය කලා. විශේෂයෙන් මෙරටට අවංක සේවයක් කරපු මේ රට ඉදිරියට ගෙනියන්න උවමනාව තිබුණ අවංක නායකයෙක් විදිහට තමයි බණ්ඩාරණායක මැතිතුමාව අපි දකින්නෙ. එතුමාගේ පිළිරුව ප්‍රතිසංස්කරණය කිරිමට විපක්ෂයක් හැටියට අපි අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, වර්තමානයේ හැටියට මේ පිළිරුව මදි. මෙය මීට වඩා පළල් විය යුතුයි. ඒ නිසා මෙය වෙනස් කරල මීට වැඩිය ලොකුවට හදන්න පුළුවන්ද කියන එකත් බලන්න ඕනෑ. ඒ නිසා අපි වෙළඳ සංගමයත් එකතු කරගෙන වෙනම සාකච්ඡා කරල මේක වෙනස් කරනවද, මෙතනම ඉදිකරනවද, වෙනත් තැනක ඉදිකරනවාද ආදි ලෙස සාකච්ඡා කරල මේ පිළිරුව ප්‍රතිසංස්කරණය කිරිම සුදුසුයි.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

එය ඉතා වැදගත් යෝජනාවක්. නගර සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක වෙනව. එත් එක්කම දුම්රිය නැවතුම්පල හැදෙනවා. ඒ සමඟ ගැලපෙන ආකාරයකට පිළිමය වෙනස් කරන්න සිදුවෙයි කියන අදහස ටික කාලයක සිට තිබුණා. දුම්රිය ස්ථානය හැදෙන්නෙ සභාවත් එක්ක කිසිම කතාවක් නැතුව. මොන ආයතනයක් මොන අමාත්‍යාංශයක් හරහා උනත් ගොඩනැගිල්ලක් හැදෙනවනම් අදාල ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවත් එක්ක සම්බන්ධීකරණයක් තියෙන්න ඕනෑ. අපි දැන් දුම්රිය දෙපාර්තමේන්තුවට කතා කරල තිබෙනව. ඒවට ගැලපෙන විදිහට අපි කමිටුවක් හැදිල මේක කතා කරමු. එතෙක් මෙතුමා කිව්ව වගේ වටේ පිරිසිදු කරල තීන්ත ආලේප කරන්න පුළුවන්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියල පක්ෂයක් තිබෙන නිසා ඔවුන්ගේ අනුමැතිය ඇතිව කෙරුනොත් වඩාත් සුදුසුයි. අපට දේශපාලන පක්ෂ භේදයක් නෑ. එතුමා අප රටේ ඉතිහාසයේ හොඳ හැරවුම් ලක්ෂයක් ඇති කරපු, රටේ නායකයෙක්.

**(05-7)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/53 - 07 දරණ යෝජනාව</u>**

අලව්ව පුස්තකාලය ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතිය ප්‍රාදේශීය සභාවේ ප්‍රමිතීන්ට අනුකූලව සහ කොන්දේසි වලට යටත්ව සාර්ථකව නිම කර ඇති බැවින් ඒ සඳහා අදාල මුදල් ලබා දෙන ලෙසට අලව්ව උතුර අරුණළු ග්‍රාම සංවර්ධන සමිතිය විසින් ඉල්ලීමක් කර ඇති අතර එම ව්‍යාපෘතියට අදාල ගෙවීම වන රු.895,750.60 ක මුදල අලව්ව උතුර අරුණළු ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව පුස්තකාලය ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතියට අදාල රු. 895,750.60 ක මුදල අලව්ව උතුර අරුණළු ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**06.** <u>ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම - නැත</u>

**<u>07.නිවාඩු ලිපි ඉදිරිපත් කිරීම</u>**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අද දින සභාවට සහභාගී නොවූ පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා හට අද දිනය නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත මන්ත්‍රීතුමන්ලාගේ හා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**<u>08.</u>**<u>කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම - නැත</u>

**<u>09. ප්‍රා.ස 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව, ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය හා ආදායම් පුරෝකථන වාර්තාව සහ ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් වාර්තාව ඉදිරිපත් කිරීම</u>**

**<u>9.1 ප්‍රා.ස 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව.</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජූලි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජූලි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජූලි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**9.2 ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථනවාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජූලි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජූලි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 ජූලි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**9.3 2022/07/01 දින සිට 2022/07/31 දින දක්වා ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022/07/01 දින සිට 2022/07/31 දින දක්වා ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

| අනු අං: | වවුචර් අංකය | ආදායකයා | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|
| 1 | 854 | හගුරන්කෙත සුමනරතන හිමි | පොසොන්පොහොය නිමිත්තෙන්පැවැත්වූ සැණකෙළිය සඳහා තැන්පත් කල ක්‍රීඩාංගන තැන්පත් වලින් කොටසක් ආපසු ගෙවීම. | 20,000.00 |
| 2 | 855 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022.07.04 පවත්වන ලද මුදල් කමිටුවේ සංග්‍රහ වියදම් සඳහාඅත්තිකාරම් | 1,500.00 |
| 3 | 856 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූනි බෝයවලාන පුස්තකාලයේ විදුලි බිල්පත්පියවීම | 2,911.80 |
| 4 | 857 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජූනි අලව්ව පොදු වෙළඳ සංකීර්ණයේ විවෘත ආලින්ද 01 සඳහාවිදුලි බිල්පත්පියවීම | 3,497.40 |

| | | | | |
|---|---|---|---|---|
| 5 | 858 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජුනි අලව්ව පොදු වෙළඳ සංකීර්ණයේ විවෘත ආලින්ද 02 සඳහාවිදුලි බිල්පත්පියවීම | 1,832.10 |
| 6 | 859 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය | 2022 ජුනි අලව්ව තාවකාලික සතිපොලවිදුලි බිල්පත්පියවීම | 5,675.10 |
| 7 | 860 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2022.05.13 සිට 2022.06.13 දක්වා අලව්ව තාවකාලික සතිපොළ ජල බිල්පත්පියවීම. | 8,988.00 |
| 8 | 861 | ඒ.ඩබ්. සචිනි මධුරංගිකා මෙනවිය | 2021 දෙසැම්බර් සිට 2022 ජුනි දක්වා පුහුණු දීමනා ගෙවීම | 53,500.00 |
| 9 | 862 | ආර්.පී.ඩී. අමරසිංහ මයා | අතිකාල දීමනා 2022 මැයි | 8,833.00 |
| 10 | 863 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | සභා වාහන සඳහා අලව්ව ඩිපෝවෙන් ඉන්ධන ලබා ගැනිමට ගත්අත්තිකාරම් (ඉන්ධන සඳහා වියදම රු.60720.00 ,ආපසු ගෙවූ මුදල රු. 14280.00, ලදුපත් අංක 73061) 2022.07.06 - RB -3571, RD-1601, PC -0366 | 75,000.00 |
| 11 | 864 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම 2022.06.29 - ZA -5067, | 30,820.00 |
| 12 | 865 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම 2022.06.28 - SB - 8367, RB-3571,RD-1601, LM -5623 | 72,680.00 |
| 13 | 866 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම 2022.06.18 - LL-7772, LL-6946, 52-8668 | 39,600.00 |
| 14 | 867 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම 2022.06.18 - ZA- 5067 2022.06.23 - PC-0366 , RD -1601, RB -3571, LM-5623 | 146,000.00 |
| 15 | 868 | සාමාන්‍යාධිකාරී , සී/ස අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම 2022.06.23 - LL-6946, 52-8668,ZA-5298 , LE-7413, ZA-5067 | 116,000.00 |
| 16 | 869 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | සභා වාහන සඳහා අලව්ව ඩිපෝවෙන් ඉන්ධන ලබා ගැනිමට ගත්අත්තිකාරම් (ඉන්ධන සඳහා වියදම රු. 50600.00 ,ආපසුගෙවූ මුදල රු. 41400.00 ,ලදුපත් අංක 73071) 2022.07.07 - LM-5623, 52-8668 | 92,000.00 |
| 17 | 870 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022 ජුනි දෛනික වැටුප් ගෙවීම | 583,231.28 |
| 18 | 871 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022.07.12 පැවැත්වූ මහ සභාවේ සංග්‍රහ වියදම් සඳහා අත්තිකාරම් | 20,000.00 |
| 19 | 872 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | Z.A. 5298 මෝටර් ග්‍රේඩරයේ වාර්ෂික බලපත්‍ර ලබා ගැනීම සඳහාඅත්තිකාරම් | 8,000.00 |
| 20 | 873 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022 ජූලි සභික දීමනා | 602,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 21 | 874 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 2022 දෙවන කාර්තුව මුද්දර බදු ගෙවීම | 19,740.00 |
| 22 | 875 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | ලබා ගත් ජල බවුසර් සඳහා ගාස්තු ගෙවීම | 7,121.52 |
| 23 | 876 | කවීෂා ඉන්ජිනියරින් සර්විස් | එල්.එම්. 5623 ගාබේජ් කම්පැක්ටරය අළුත් වැඩියාව | 4,200.00 |
| 24 | 877 | සීවලි මෝටර්ස් | පී.සී. 0366 ,කැබ් රථය අළුත්වැඩියාව | 2,330.00 |
| 25 | 878 | පෝස්ට් මාර්සටර් ජනරාල් | 2022 පෙබරවාරි සිට මැයි දක්වා නිදහස් තැපැල් පහසුකම් සඳහා ගෙවීම | 28,633.00 |
| 26 | 879 | ශ්‍රී සෝනුත්තර වෘත්තීය පුහුණු ආයතනය | ලිපි ද්‍රව්‍ය මුද්‍රණය කිරීමේ ගාස්තු | 196,276.00 |
| 27 | 880 | ශ්‍රී සෝනුත්තර වෘත්තීය පුහුණු ආයතනය | 2021 අවසන් ගිණුම් වාර්තා බැඳීමේ ගාස්තු | 1,600.00 |
| 28 | 881 | පේපර් කෝනර් | ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | 2,700.00 |
| 29 | 882 | පියසේන විජේසූරිය මයා | 2022 මැයි මහරච්චිමුල්ල පුස්තකාලයේ පුවත්පත් බිල් පියවීම | 8,410.00 |
| 30 | 883 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 2022 අප්‍රේල් මහරච්චිමුල්ල උප කාර්යාලයේ දුරකථන බිල්පත් පියවීම | 1,164.72 |
| 31 | 884 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 2022 මැයි මහරච්චිමුල්ල උප කාර්යාලයේ දුරකථන බිල්පත් පියවීම | 1,207.85 |
| 32 | 888 | එස්.එම්. ධම්මිකා කුමුදුනී මිය | ගමන් වියදම් | 900.00 |
| 33 | 889 | එච්. විනීතා ප්‍රියමානි මිය | 2022 ජූනි ගරු සභාපතිතුමියගේ පුද්ගලික සහකාර දීමනාව | 22,000.00 |
| 34 | 890 | ජේ.ඒ. ලලිත් පද්මසිරි මයා | ගමන් වියදම් 2022 ජූනි | 2,826.40 |
| 35 | 891 | ටී.ඒ.ඩී.එස්. ප්‍රියදර්ශන මයා | 2022 අප්‍රේල්, මැයි, ජූනි මාස සඳහා පුහුණු දීමනා | 15,500.00 |
| 36 | 892 | ඩී.ඒ. ජගත් පුෂ්ප කුමාර මයා | අතිකාල දීමනා 2022 ජූනි | 8,787.00 |
| 37 | 893 | එම්.එම්.උදය කුමාර මයා | අතිකාල දීමනා 2022 ජූනි | 6,343.00 |
| 38 | 894 | ඩබ්.එච්. කීර්තිසේන මයා | අතිකාල දීමනා 2022 ජූනි | 10,102.00 |
| 39 | 895 | ලලිත් පත්මසිරි මයා | අතිකාල දීමනා 2022 ජූනි | 2,484.00 |
| 40 | 896 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022 ජූනි සතිපොළ දීමනා ගෙවීම | 16,100.00 |

| | | | | |
|---|---|---|---|---|
| 41 | 897 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | සභා වාහන සඳහා අලව්ව ඩිපෝවෙන් ඉන්ධන ලබා ගැනිමට ගත්අත්තිකාරම් (ඉන්ධන සඳහා වියදම රු. 69000.00 ,ආපසුගෙවූ මුදල රු. 23000.00 ,ලදුපත් අංක 73093 ) 2022.07.14- LL-6946, LM-5623 | 92,000.00 |
| 42 | 898 | උපාලි තිලකරත්න මයා | ගමන් වියදම් | 1,400.00 |
| 43 | 899 | ජයන්ත එදිරිසිංහ මයා | ගමන් වියදම් 2022 ජූනි | 3,060.00 |
| 44 | 900 | එච්.එම්. කේ. සී. හේරත් මයා | ගලි සේවාව ලබා දීම සඳහා තැන්පත් කල මුදලින් කොටසක් ගෙවීම | 4,300.00 |
| 45 | 901 | එම්.එම්.එස්. මධුහංස මයා | 2021.06.11 දින පැවති සංගීත සංදර්ශනය සඳහාතැන්පත් කල මුදලින් කොටසක් ගෙවීම | 5,000.00 |
| 46 | 902 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | සභා වාහන සඳහා අලව්ව ඩිපෝවෙන් ඉන්ධන ලබා ගැනිමට ගත්අත්තිකාරම් (ඉන්ධන සඳහා වියදම රු. 55000.00 ,ආපසුගෙවූ මුදල රු. 5000.00 ,ලදුපත්අංක 73164 ) 2022.07.19 - RD -1601, SB -8367, RD -9440, PC-0366 | 60,000.00 |
| 47 | 903 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | සභා වාහන සඳහා අලව්ව ඩිපෝවෙන් ඉන්ධන ලබා ගැනිමට ගත්අත්තිකාරම් (ඉන්ධන සඳහා වියදම රු. 35200.00 ,ආපසුගෙවූ මුදල රු. 4800.00 ,ලදුපත්අංක 73169) 2022.07.19 - 52-8668, LM-6946 | 40,000.00 |
| 48 | 904 | එම්.එම්. තොමස් ජයකඩු මයා | 2022 ජූනි මස සඳහා අලව්ව තාවකාලික සතිපොළ බදු කුලී ගෙවීම | 50,000.00 |
| 49 | 913 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022 ජූලි ස්ථිර වැටුප් ගෙවීම | 5,579,202.21 |
| 50 | 914 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් | Z.A. බැකෝ ලෝඩරයේ වාර්ෂික රක්ෂණ බලපත්‍රය යාවත්කාලීන කිරීම | 80,796.53 |
| 51 | 915 | ඩබ්.ඩී. කුමාර මයා | 2022 ජූනි රථ ගාල් ගාස්තු 25% දීමනා ගෙවීම | 4,837.50 |
| 52 | 916 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022.07.28 පවත්වන ටෙන්ඩර් වෙන්දේසි කමිටු වියදම් සඳහා අත්තිකාරම් | 5,000.00 |
| 53 | 917 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | 2022.07.25 සිට 28 දක්වා පවත්වන විශේෂ ඩෙංගු වැඩසටහනේ වියදම් සඳහාඅත්තිකාරම් | 3,000.00 |
| 54 | 918 | ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව | බෝයවලාන පුස්තකාල භූමියේ ගෙවතු වගා කටයුතු වියදම් සඳහා අත්තිකාරම් | 2,000.00 |

**සේවක ණය ගිණුම්**

| | | | | |
|---|---|---|---|---|
| 50 | 21 | ඒ.ඒ.සී.කේ. අලහකෝන් මිය | ආපදා ණය ගෙවීම | 45,826.00 |
| | | | මුළු එකතුව | **8,226,916.41** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022/07/01 දින සිට 2022/07/31 දින දක්වා ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022/07/01 දින සිට 2022/07/31 දින දක්වා ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද වියදම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>10. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම</u>**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ලබන අවුරුද්දේ පෙබරවාරි මාසයේ පළාත් පාලන මැතිවරණය තියෙනවා. අපේ මන්ත්‍රී ප්‍රතිපාදන වල මුදල් ප්‍රතිපාදන ප්‍රමාණය මගින් සංවර්ධන කටයුතු කරන්න අවසර දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. මුදල් ආවම ගෙවීම් කිරීමට ගැටළුවක් නැහැ. මුදල් ලැබුණු දිනයක ඒ කරපු පිළිවෙල අනුව ගෙවන්න. ඊට අමතරව තව මුදල් ප්‍රමාණයක් සෑම මන්ත්‍රීවරයෙකුටම වැඩි කරල දෙනවා නම් ඒකත් වටිනා දෙයක් වේවි. ඒ සහයෝගය ලබාදෙන්න කියල ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පරමාඋල්ල කුඹුක් ගහ ලග වංගුවේ වලවල් හැදිල බොහොම අනතුරුදායක බවක් ගන්නවා. එම ස්ථානය වංගුවක් නිසා පේන්නෙ නෑ. අනතුරු සිදු වීමේ වැඩි ප්‍රවණතාවයක් ගන්නවා. ඒ නිසා එම ස්ථානය පිළිසකර කිරීමට යම් ක්‍රියාමාර්ගයක් ගන්නවා නම් හොදයි කියල මම ප්‍රකාශ කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

එම මාර්ගය මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ගයක්. නමුත් එම ස්ථානයේම සිටින යත්තල්ගොඩ මහතා සතුව මාර්ගය සකස් කිරීමට අවශ්‍ය වාහන සියල්ල තිබෙනවා. මාර්ගය පිළිසකර කිරීම සඳහා සහයෝගයක් ලබාදෙන ලෙස එතුමාට මතක් කිරීමක් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, හුම්බුළුව කලල්පිටිය දක්වා මාර්ගය ඉක්මනින් මැනුම් කටයුතු කර ගැනිමට කාර්මික නිලධාරි මහතාගේ සහයෝගය ලබා දෙන්න කියල ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පරමාඋල්ල කොට්ඨාශයේ සිටින මරණ පරීක්ෂකතුමාගේ නිවසට යන මාර්ගයේ නිවසට ප්‍රවේශ වන ස්ථානය කාණු කැපීම නිසා ප්‍රවේශ මාර්ගය අවහිර වී තිබෙනවා. එම නිවසේ රෝගී කාන්තාවන් දෙදෙනෙක් දැන් ජීවත් වෙන්නෙ. ඒ නිසා සභාවෙ තිබෙන කාණු

කැට යොදා එම ස්ථානය පිළිසකර කර ගැනිමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

එම ස්ථානය මාර්ග සංවර්ධන අධිකාරිය මගින් පාර කාපට් කරන විට අයින් කරල තිබෙන්නෙ. අපි මාර්ග සංවර්ධන අධිකාරියට කතාකරල තිබෙනවා එම ස්ථානය යථාවත් කරල දෙන්න කියල. ඒක ඔවුන්ගේ වගකීමක්. එසේ නොහැකි වුනොත් අපි එම ස්ථානය පිළිසකර කරල දෙමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මාර්ගය දෙපස කැලෑ වැහිල තිබෙනවා. පාර ගමන් කරන්නත් බැරි තත්වයක් දැන් තිබෙන්නේ. ඒ නිසා කම්කරු මහතුන් යොදා එම කැලෑ කපන්න කියල ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

ඔබතුමා ලිපියක් ඉදිරිපත් කරන්න. අපි එම කාර්යය සිදුකර දෙන්නම්. ප්‍රතිපත්ති සකස් කරන යෝජනා ඉදිරිපත් කරන විට අපි යෝජනාවක් දාමු ප්‍රධාන පාරවල් වල දෙපැත්ත කැලෑ වැහිල තිබෙන නිසා ඒවා කපන්න අවශ්‍ය කටයුතු සිදු කරන්න කියල.

ඒ වගේම තව කාරණයක් තිබෙනවා මේ ජපන් කොරියන් භාෂා පාසල ගැන අපේ කිසිම වගකීමක් නෑ. කැගල්ල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරියක් ඇවිල්ල මම හිටියෙ නැති දවසක මේ ලිපි ටික භාර දීල ගිහින් තිබනවා. මේක දිහා බැලුවම දුරකථන අංකයක්, වෙබ් සයිට් එකක් තිබුණට වගකීමක් දරණ පුද්ගලයෙක් නැහැ. ලිපිය දෙන්න කිවු නිසා දුන්නට අපේ කිසිම වගකිමක් නැහැ. මීට පෙරත් මම නොදැනුවත්ව එහෙම ලිපියක් ගිහිල්ල තිබුණ. ඊලඟ කාරණය තමයි පසුගිය තෙල් අර්බුද කාලයේදී විවිධ ආයතන එකතු වෙලා ඒ සඳහා වැඩපිළිවෙලක් හදයි කියල සිතුවත් එහෙම වුනේ නැහැ. මේ මන්ත්‍රීතුමන්ල , නිලධාරින් අපහසුතාවයට පත් වෙන විට අපි ඒකට සාකච්ඡාවක් තියල ක්‍රමවේදයක් හදා ගත්ත. ඒ සඳහා විපක්ෂ නායකතුමා, මන්ත්‍රීවරුන් මෙන්ම නිලධාරීනුත් උදවු උනා. ඉන්පසු තෙල් ගෙනවිත් බෙදා දීමේදී ජයතිලක මන්ත්‍රීතුමා, වර්ණසූරිය මන්ත්‍රීතුමා උදේ සිට ඇවිල්ල ඒ තෙල් බෙදා දුන් දවස් තුනේම ඒ වගකීම දැරුවා. මම ගරු මන්ත්‍රිතුමන්ලාට, නිලධාරි මණ්ඩලයට ස්තූතිවන්ත වෙනවා. රියදුරු මහත්වරු, මේවට අදාල නැති නිලධාරීනුත් ඇවිල්ල තෙල් ටික පරිස්සම් කරගෙන නියමිත ප්‍රමාණයට බෙදා දීම, මුදල් ගැනිම ආදී සියල්ල නියමිත ආකාරයට කෙරුණා. ඒ අතරේ තමයි QR සිස්ටම් එක ආවේ. ඊට පසු අපේ වගකීම සැහැල්ලු වුණා. නමුත් අපි ඉල්ලා තිබුණු ප්‍රමාණය අපට තුන් වතාවකටයි ලැබුණෙ. තුන්වන වතාව ගන්න හදනකොට සමූපකාරයෙන් දෙනව කියල ඒ දවසට දුන්නේ නැහැ. පහුවදා උදේ එන්න කීව. එදා ගියාම QR ප්‍රශ්නෙ ඒ ගොල්ලො මතු කර ගත්ත. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් බලනව ඒ නිසා දෙන්න බෑ කිවුව. 8 කණුව පිරවුම්හලට කතා කලහම ඒ අයත් කීව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අධීක්ෂණය කරනව කියල. ඉන් පසු වාරියගොඩ පිරවුම්හලට කතා කල විට කිසි ප්‍රශ්ණයක් ඇතිවුනේ නෑ. QR ටික එකතු කර යැවූ පසු එම ස්ථානයෙන් අපට ඒ තෙල් ප්‍රමාණය ලැබුණා. එම කටයුතු ක්‍රමවත්ව සිදු කර ගැනිමට සහය දීම පිළිබඳ ගරු මන්ත්‍රීතුමන්ලාටත්, ලේකම්තුමිය ප්‍රමුඛ නිලධාරී මණ්ඩලයටත් මගේ ස්තූතිය පිරි නමනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඇත්ත වශයෙන්ම තෙල් නොමැති වීම නිසා මන්ත්‍රීවරු පීඩනයකින් හිටියේ. මේ කටයුත්ත මගින් යම්තාක් සහනයක් ඇති වුණා. ඒ වෙනුවෙන් මේ හැමෝම කැප වුනා. ඒ සඳහා ස්තූතිවන්ත වෙනව. ඒ සමඟම අලව්ව විවිධ සේවා සමූපකාර සමිතියට අපේ සභාවෙන් ලක්ෂ ගණන් ගණුදෙනු කරලත් කිසිම සහනයක් නැත්නම්, අපි ගැන අවධානයට තියෙන අපි ගැන බලන පිරවුම්හලක් එක්ක නීත්‍යානුකූල අපට ගනුදෙනු කරන්න බැරිද කියන ප්‍රශ්නය යොමු කරන්න කැමතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සමූපකාර ආයතනය ගැන අපි විවිධ අවස්ථාවල කතා කලා. නමුත් අපට එකවතාවක් හෝ තෙල් ලබාදිම පිළිබඳ ස්තූති කරල ලිපියක් යවන්න. එත් අපිට දක්වපු දායකත්වය ගැන අපි සතුටු වෙන්නෙ නෑ. මේ තෙල් ලබා දීමේ ඔබතුමියගෙ වැඩසටහනට අපිත් පැමිණියා. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය මේ සඳහා ලොකු කැපකිරිමක් කලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ තෙල් අර්බුදය මටත් උග්‍ර ලෙස බලපෑවා. නමුත් ඒ ගැටළුව යම් තරමක් හෝ විසඳා ගැනිමට සභාපතිතුමිය ප්‍රමුඛ මන්ත්‍රීවරුන් සහ ලේකම්තුමිය මෙන්ම කාර්ය මණ්ඩලය ගත් ඒ ප්‍රයන්තයට හදවතින්ම ස්තූතිවන්ත වෙනවා. අපේ සභාවේ මාසෙකට ලක්ෂ 10 විතර අපි සමූපකාර පිරවුම්හලට දෙනවා. ඒ නිසා සභාවේ වාහන වලටත් අඩුම තරමින් තෙල් ටික ලබා දෙන්න කටයුතු කලේ නෑ. ඒ පිළිබඳවත් දන්වලා ලිපිය යොමු කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජිව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සමූපකාර පිරවුම් හලට මාසෙකට අපි ලක්ෂ 10 ක් විතර ලබාදුන්නත් අපේ වාහන පිළිබඳ කිසිම තැකීමක් එම ආයතනයෙන් කලේ නෑ. නමුත් වාරියගොඩ පිරවුම්හලෙන් අපට කිසිම පැකිලීමකින් තොරව අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය ලබා දුන්නා. මින් ඉදිරියට අපි සභාවේ වාහන වලට ඉන්ධන ලබා ගැනිමේදී අපට යම් පිහිටක් වු එම ආයතනය පිළිබඳවත් පොඩි අවධානයක් යොමු කරන්න වෙනවා. සභාපතිතුමිය වෙනුවෙන් අපේ සභාවෙ නිලධාරි මණ්ඩලයට මම ස්තූතිවන්ත වෙනවා. මේ වෙනුවෙන් දින ගණනක් ලොකු කැපකිරීමක් සිදුකලා. ඒ වෙනුවෙන් මගේ ගෞරවය පුද කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ජා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රිතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තූතිය පල කරනවා.

අද දිනට නියමිත සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 4.00ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

2022/08/09
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.